# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,961 - 2016 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2016.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු — ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මැයි මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මාර්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මුතූර් | මුතූර් කොට්ඨාසයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, |

04-157

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මැයි මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | මහවැව | මාරවිල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ දකුණු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

04-268

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය්.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මැයි මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මාර්තු මස 11 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | සොරණාතොට | වියළුව කොට්ඨාසයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

04-267

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මැයි මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | ගොමරන්-කඩවෙල | බටහිර කට්ටුකුලම්පත්තු මැදවච්චිය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය. |

04-158

---

**අධිකරණ අමාත්‍යාංශය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2016

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ පවතින පුරප්පාඩුව සඳහා සුදුස්සකු තෝරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ''ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.04.29 වැනි දින වේ.

**සටහන.**-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මකවන දිනය අමාත්‍ය මණ්ඩලයේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 22 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 අප්‍රේල් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.*

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :
   (i) මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිතය.
   (ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර, III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නොවූ නිලධාරියකු නම් තනතුරට පත් වී වසර 05ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
   (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතු ය.
   (iv) අමාත්‍ය මණ්ඩල තීරණවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. වැටුප් පරිමාණය :
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615-10x1335-8x1630-17x2170- රු. 110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමිවේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 76,175 ක් වන අතර වැටුප් පියවර 20 වේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

04. සුදුසුකම් :
   (i) අධ්‍යාපන සුදුසුකම් :
   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ ආයතනයක් විසින් පිරිනමනු ලැබූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතු ය.
   (ii) වෘත්තීය සුදුසුකම් :
   රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව, අධිකරණ අමාත්‍යාංශයේ හෝ වෙනත් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක විධායක ගණයේ තනතුරක සේවය කිරීම සහ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වීම.
   (iii) පළපුරුද්ද :
      (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව, විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ විධායක සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක 07 උපයාගෙන තිබිය යුතු ය.
      (ii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්විය යුතු ය.
      (iii) පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබිය යුතු ය.

05. වයස් සීමාව :- අදාළ නොවේ.

06. කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. වෙනත් සුදුසුකම් :
   (i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
   (ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
   (iii) මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතුය.
   (iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දෙනු ලබන අතර, එම පරීක්ෂණයේ දීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය :

| | ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. | අමතර අධ්‍යාපන සුදුසුකම් | 45 | |
| 02. | දේශීය/විදේශ පුහුණුවීම් | 20 | |
| 03. | අයදුම්කරු විසින් ප්‍රකාශනයට පමුණුවා ඇති නීති පරික්ෂණ පිළිබඳ ප්‍රකාශන | 20 | |
| 04. | අතිරේක පළපුරුද්ද | 10 | අදළ නොවේ. |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 | |
| | එකතුව | 100 | |

10. (i) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු, අතර, 1-14 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 15 සිට අවසන්වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුය-** (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් නොඇමිණිය යුතු ය.
(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතු ය.

11. අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන නියෝග, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 මාර්තු මස 04 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

**අධිකරණ අමාත්‍යාංශය**

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
04. දුරකථන අංකය :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
07. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : වර්ෂ :————. මාස :————. දින :————.
09. ජාතිය :————.
10. විවාහක/අවිවාහක බව :————.
11. නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය පිළිබඳ විස්තර :
විශ්වවිද්‍යාලය :————.
විෂයය ක්ෂේත්‍රය :————.
උපාධිය පිරිනැමූ දිනය :————.
භාෂා මාධ්‍යය :————.
12. නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :————.
13. නීතිඥයකු ලෙස වෘත්තීය පළපුරුද්ද : වසර ගණන :————.
14. සේවයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :- වසර ගණන :————.
   (i) දැනට සේවය කරන තනතුර :————. (ii) පංතිය හෝ ශ්‍රේණිය :————.
   (iii) එම ශ්‍රේණියට උසස් කළ දිනය :————. (iv) තනතුරට පත්වූ දිනය :————.
   (v) එම තනතුරේ ස්ථිර කළ දිනය :————.
   (vi) වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————.
   (vii) පූර්ව සේවා කාලය පිළිබඳ විස්තර :————.

| | *ආයතනය* | *දරූ තනතුර* | *සේවා කාලය ( ……………දින සිට …………දක්වා)* |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 ඡේදයට අනුව වෘත්තීය සුදුසුකම් :
   (i) විධායක ගණයේ පළමු ශ්‍රේණියේ නිලධාරියකු ද යන වග :————.
   (ii) විධායක ගණයේ දෙවන ශ්‍රේණියේ නිලධාරියකු නම් දෙවන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත් ද යන්න හා නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇත් ද? :————.
   (iii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් ලබාගෙන ඇත් ද? :————.
   (iv) පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත් ද? :————.
16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 09 ඡේදයට අනුව සුදුසුකම් :-
   (i) ……………………………………………………………………
   (ii) ……………………………………………………………………
   (iii) ……………………………………………………………………
   (iv) ……………………………………………………………………
   (v) ……………………………………………………………………
   (vi) ……………………………………………………………………
   (vii) ……………………………………………………………………
   (viii) ……………………………………………………………………
17. භාෂා ප්‍රවීණතාව (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න.) :

| | *ඉතා හොඳයි* | *හොඳයි* | *සාමාන්‍යයි* | *දුර්වලයි* |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

**අයදුම්කරුගේ සහතිකය**

…………………………… වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව)**

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන …………… මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන …………… පළාත් සභාව යටතේ වන …………… අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ …………… තනතුරක සේවය කරන බව ද, පූර්වාසන්න වසර 07ක කාල සීමාව තුළ ඔහුගේ/ඇයගේ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට අවවාද කිරීම් හැර කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය වී නොමැති බව ද, ගැසට් නිවේදනයේ 04 වැනි ඡේදයට අනුව පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදළ ගැසට් නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්ගේ/
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

04-237

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2015/2016

1st and 2nd Efficiency Bar Examination and Second Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2015/2016

අංක 1958 දරන 2016.03.11 දිනැති රජයේ ගැසට් නිවේදනයෙහි, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳව පරීක්ෂණය 2015/2016 මැයෙන් පළ කරනු ලැබූ ගැසට් නිවේදනයෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද ආදර්ශ අයදුම්පත පහත දැක්වෙන පරිදි සංශෝධනය විය යුතු බවද විභාග දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය 2016.04.12 ලෙස නොවෙනස්ව පවතින බවද මෙයින් දන්වා සිටිනු ලැබේ.

චිත්‍රාංගනී වාගීස්වර,
ලේකම්/විදේශ කටයුතු.

2016 මාර්තු මස 25 වැනි දින.
විදේශ කටයුතු අමාත්‍යාංශය,
තැ. පෙ. අංක 583,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01

**ආදර්ශ අයදුම්පත**

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

☐
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරින් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2015/2016

1st and 2nd Efficiency Bar Examination and Second Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2015/2016

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

| | | |
|---|---|---|
| සිංහල | 2 | ☐ (කොටුව තුළ අදාළ අංකය සඳහන් කරන්න) |
| දෙමළ | 3 | |
| ඉංග්‍රීසි | 4 | |

01. ඉල්ලුම් කරන විභාගය :
(අදළ අංකය කොටුව තුළ සඳහන් කරන්න.)

| විභාගය | අදළ අංකය |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| දෙවන භාෂාව | 3 |
| විදේශ භාෂාව | 4 |

02. (අ) (i) මුල’කුරු සමග අගට යෙදෙන නම, (සිංහලෙන්/දෙමළෙන්:..........................
(ii) මුල’කුරු සමග අගට යෙදෙන නම, (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................
(අගට යෙදෙන නමට පසුව මුල් අකුරු සඳහන් කරන්න)
උදා : (Silva A. B.)
(ආ) (i) මුල’කුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/ දෙමළෙන්) :————.
(ii) මුල’කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. ස්ත්‍රී/පුරුෂ භාවය :- ☐
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

07. ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය :

වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

08. වර්තමාන තනතුර : ................................................

09. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම් කරන විභාගයට අදළ විෂයය අංක පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විෂයයන් හැර වෙනත් විෂයයන්වලට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.)

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| i | |
| ii | |
| iii | |
| iv | |
| v | |
| vi | |

10. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාගය අංකය, විෂයය, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක .................... දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.

ගෙවන ලද විභාග ගාස්තුව රු. ...........................

.........................................
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්,........................මයා/මිය/මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සනත් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර :..............
දිනය:..........................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

04-346

---

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව

**ආධුනිකයින් බඳවා ගැනීම - 2016 ජූලි**

ශ්‍රී ලංකා - ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :

1. *පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :*

| *පාඨමාලාවේ නම* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) | - | අවු. 03 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය, සහ විද්‍යාව සමග විෂයයන් 6ක් සමත් වී තිබීම. |
| 02. විදුලි කාර්මික ශිල්පී (විශේෂ) | 4 වැනි මට්ටම | අවු. 03 | |
| 03. ඉදිකිරීම් සුපරීක්ෂක | 4 වැනි මට්ටම | අවු. 1 1/2 | |
| 04. ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 02 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත් වීම. |
| 05. යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) (Machinist Special) | 4 වැනි මට්ටම | අවු. 03 | |
| 06. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව - (ICT) | 4 වැනි මට්ටම | අවු 01 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම සහ අංක 06, 07 සඳහා මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. |
| 07. පරිගණක චිත්‍ර නිර්මාණ පාඨමාලාව | 4 වැනි මට්ටම | අවු. 01 1/2 | |
| 08. පෑස්සුම් ශිල්පී (විශේෂ) - (Welder) | 4 වැනි මට්ටම | අවු. 03 | අවම වශයෙන් අ. පො. ස. (සා. පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. |
| 09. ජලනල කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 02 | |
| 10. දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වැනි මට්ටම | අවු. 02 | |

2. *වයස.*— 2016.04.27 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

3. *පුහුණුව පිළිබඳ විස්තර :*

3.1 සියලු ම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවැනි භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. දැව කාර්මික ශිල්පී හා පෑස්සුම් ශිල්පී වැනි කාර්මික ශිල්ප සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩිවී ඇත. පෑස්සුම් ශිල්පී පාඨමාලාවේ දී නවීන පෑස්සුම් ශිල්පී ක්‍රම ද පුහුණු කරනු ලැබේ. (MMA/GAS/TIG/MIG/MAG/PLASMA/Stud Welding, Destructive and Non destructive testing methods)

4. *තෝරා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

5. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව, 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත් හෝ www. ietimoratuwa.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2016 අප්‍රේල් මස 27 වැනි දිනට පෙර, ''අධ්‍යක්ෂ/විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2016 ජූලි" යන්න සඳහන් කළ යුතු ය.

5.2 මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 3131001536569840ට බැර කරන ලෙස සඳහන් කරමින් ඕනෑම බැංකු ශාඛාවකට රු. 500 ක් ගෙවා ලබා ගත් ලදුපතෙහි ඡායා පිටපතක් සහ ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම් පත සමඟ එවිය යුතු ය.

5.3 මුදල් ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතු ය.

5.5 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරන අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

6. තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. කිසිදු හේතුවක් නිසා හෝ ගෙවන ලද මුදල් ආපසු නොගෙවන අතර, ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

ආධුනිකයින් බඳවා ගැනීම - 2016 ජූලි

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය
2. මුල’කුරු සමග නම :————.
3. ලිපිනය :————.
4. පදිංචිය : (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) දිස්ත්‍රික්කය :————.
5. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
6. මුදල් ගෙවන ලද ලදුපතෙහි අංකය සහ බැංකු ශාඛාවේ නම :————.
7. උපන් දිනය :————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————.
9. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් X ලකුණින් සළකුණු කරන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ. පො. ස. (උ.පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 වන ශ්‍රේණිය | |

අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල :

| | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල :

| | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

| *හදාරා ඇති පරිගණක පාඨමාලාවන්* |
|---|
| |
| |
| |
| |

10. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. ————.
2. ————.
3. ————.

ලදුපත ඇලවිය යුතු ස්ථානය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04-246

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 09 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නිරතව සිටින නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ'' ''ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.05.02 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

මෙම විභාගයේ එක් එක් විෂයය සඳහා 40% හෝ ඊට ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයින්ට ලබා දෙන ලකුණු, ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී එම ප්‍රමාණයද විවෘත ධාරාව යටතේ බඳවා ගැනේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක් තුළදී ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධයන්හි ඇතුළත් කොන්දේසිවලටද, මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව එස්එල් 1-2006 රු 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *අධ්‍යාපන සුදුසුකම් :*
(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නිර්මිත පරිසරය පිළිබඳව උපාධියක් ලබා ඇති රජයේ සේවයේ වසර පහ (5) ක ස්ථිර හා සතුටුදායක සේවා කාලයක් සහිත සංවර්ධන සහකාරවරු,
(ii) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සම්මත පාඨමාලාව 1 කොටස සමත් රාජ්‍ය සේවයේ වසර 10 ක් සහිත පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන්

සහ

උසස්වීම් ලත් දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ සැලසුම් ශිල්පීන්.

05. *කායික සුදුසුකම් :-*
(i) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

06. *වයස් සීමාව :-* අදාල නොවේ.

07. *වෙනත් සුදුසුකම් :-*
(i) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

08. 8.1 *ලිඛිත විභාගය :-*
8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
8.1.2 විෂය නිර්දේශය :

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය පැය* |
|---|---|---|---|---|
| 01 | වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම | 100 | 40 | 03 |
| 02 | පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 | 02 |

විෂය අංක 01 - වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම
මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් පරිදි සකස් වේ.
කාලය පැය තුනයි.

I හා II කොටස් වලින් අනිවාර්යය ප්‍රශ්න දෙකකට ද (ලකුණු 20 බැගින්) අනෙක් කොටස් තුනේ ප්‍රශ්න 6 න් හතරකට ද පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 15 බැගින්) සමත් ලකුණු ප්‍රමාණය 40%

**I කොටස- රාජ්‍ය අංශයේ වාස්තු විද්‍යාඥයකුගේ ප්‍රායෝගික භූමිකාව**
1. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය අතර වාස්තු විද්‍යා පරිචයෙහි වෙනස
2. වාස්තු විද්‍යාඥ භූමිකාවේ පරාසය වාසි සහ අවාසි
3. ජනතාව කෙරෙහි වන වගකීම්
4. සංවිධානය කෙරෙහි වන වගකීම්

**II කොටස -**
1. මූලික අධ්‍යයනයන් හා විමර්ශන
2. සංකල්පමය නිර්මාණය හා මූලික ඇස්තමේන්තු සඳහා වන ප්‍රවේශය
3. රීති සැලසුම්කරණය හා ගොඩනැගීම සහ අවශ්‍ය අනුමැතීන් හා පැහැදිලි කිරීම් ලබාගැනීම
4. අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කළ යුතු සැලසුම් කට්ටලය
5. වාස්තු විද්‍යාත්මක විස්තරාත්මක ක්ෂේත්‍ර සැලසුම් හා පිරිවිතර
6. අනෙකුත් උපදේශකවරුන් (ව්‍යුහ සැලසුම් සහ සේවා සැලසුම්) සමඟ සම්බන්ධීකරණයෙන් විස්තරාත්මක දත්ත සකස් කිරීම

**III කොටස - සංවිධානයේ කාර්යයන් සහ මෙහෙයුම් මාධ්‍යය**
1. සංවිධානයේ දැක්ම හා මෙහෙවර
2. සංවිධානයේ භූමිකාව හා කාර්යයන්
3. සංවිධාන ව්‍යුහය
4. සංවිධානයේ කාර්යයන් ඉටු කිරීමේදී එහි එක් එක් අංශයෙහි රාජකාරි හා වගකීම් හා අන්තර් සම්බන්ධතා
5. අනෙක් රාජ්‍ය ආයතන සමඟ ඇති සම්බන්ධතා

**IV කොටස** - ව්‍යාපෘතියේ පූර්ව ඉදිකිරීම් අවධිය තුළ ව්‍යාපෘතියට වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය
1. ලන්සු ලියකියවිලි හා ආයතන ඇස්තමේන්තු
2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
3. පූර්ව ටෙන්ඩර් රැස්වීම හා ටෙන්ඩර් කටයුතු
4. තාක්ෂණික ඇගයුම් හා ටෙන්ඩර් මණ්ඩල වර්ග
5. ගිවිසුම හා කොන්ත්‍රාත් පිරිනැමීම

**V කොටස** - ව්‍යාපෘති ක්‍රියාත්මක ක්‍රියාවලිය තුළ හා පසු කොන්ත්‍රාත් අවධිය තුළ වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය
1. වැඩ බිමෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්
2. තත්ව පාලන ක්‍රියාපරිපාටි
3. ඉදිකිරීමේ කණ්ඩායම සමඟ සම්බන්ධීකරණ පවත්වා ගැනීම
4. නිර්මිත පරිසරය තක්සේරු කිරීම හා පශ්චාත් විශ්ලේෂණ කටයුතු
5. නඩත්තු අත්පොත්

විෂය අංක 02 - පොදු ප්‍රශ්න පත්‍රය
මෙම ප්‍රශ්න පත්‍රය පැය 02 කට සීමා කෙරේ. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.
I කොටස : සියලුම විෂයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

II කොටස : ආර්ථික දේශපාලනික, සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.
ප්‍රශ්න පත්‍ර ව්‍යුහය :
* ඉහත ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න බහුවරණ හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක.
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

8.1.3 ප්‍රතිඵල නිකුත් කිරීම :

ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂයින්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ, රාජ්‍ය සේවා කොමිසමේ දැනුම් දීම පරිදි නියම කරන ලද ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

8.2 සම්මුඛ පරීක්ෂණය
8.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *මුළු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 20 |
| (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශ්චාත් උපාධියක් | 10 | |
| (ii) පූර්ව වෘත්තීය සුදුසුකම | 10 | |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් : | | 20 |
| (i) වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන (ඒවා පළ කරන ලද මාධ්‍යයන් සහ ISBN අංක ලබා තිබේ ද යන්න සනාථ කළ යුතු ය. එකකට ලකුණු 01බැගින්) | 05 | |
| (ii) වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව දේශීය/විදේශීය පිළිගත් ආයතනයන්හි දරන ලැබූ තනතුරු (අදාල සේවා සහතික ඉදිරිපත් කළ යුතු ය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| (iii) වර්තමාන සේවා ක්ෂේත්‍රය තුළ ලද සම්මාන/ප්‍රශංසා (පොදු 230 ආකෘති පත්‍ර මගින් හෝ පිළිගත හැකි සහතික පත්‍ර මගින් සනාථ කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| (iv) සේවා ක්ෂේත්‍රයට අදාළව කරනු ලැබූ නව නිපැයුම් (නව නිපැයුම් ලෙස පිළිගනු ලැබූ ආයතන මඟින් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කළ යුතු ය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| 3. වෘත්තීය පළපුරුද්ද | | 55 |
| (i) තනි ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස<br>- පොදු කාර්යාල<br>(වර්ග අඩි 300 සිට 500 දක්වා නිවාස හා රජයේ පොදු කාර්යාල ගොඩනැගිලි) | 15 | |
| (ii) අර්ධ මහල් ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි<br>(තට්ටු 2 සිට 5 දක්වා) | 10 | |
| (iii) උස ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි<br>(තට්ටු 6 ට වැඩි මහල් ව්‍යාපෘති) | 10 | |
| (iv) ජනාවාස හා ප්‍රධාන ව්‍යාපෘති සැලසුම්<br>- නිවාස යෝජනා ක්‍රම<br>- Master Plan<br>- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති | 10 | |
| (v) වෙනත්<br>- අමතර නිර්මාණ (උදා :- ප්‍රදර්ශන භූමි)<br>- සමාජ සේවා දායකත්වය<br>- (Housing Clinic)<br>- වෘත්තියට අදළලව වෙනත් අධ්‍යාපන පාඨමාලා හදාරා තිබීම<br>(උදා.:- හරිත ගොඩනැගිලි)<br>ඉහත කරුණු සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ද ඉදිරිපත් කළ යුතුය) | 10 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | 05 |
| මුළු ලකුණු | | 100 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම හා සුදුසුකම් පරීක්ෂා කිරීම කරනු ලැබේ.

09. විභාග කොන්දේසි :
(i) විභාගය, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර 02 සඳහා පෙනී සිටිය යුතු ය.
(ii) විභාග ගාස්තුව රු. 1,000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාලගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපතෙහි දාරයක් මගින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.
(iii) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.
(iv) විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන:-** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

නිවේදනයෙහි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මි. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස්කළ යුතු අතර, 1.0 සිට 3.2 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 3.3 සිට 6.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 3 පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.
(vii) ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබා ගෙන, නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.
(viii) මෙම විභාගය 2016 ජූලි මස කොළඹ දී පවත්වනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.
(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.
(x) අපේක්ෂකයාගේ අනන්‍යතාවය :- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**සැලකිය යුතුය :-** (අ) අයදුම්පතට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.
(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

10. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016 මාර්තු මස 17 වැනි දින.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන සීමිත තරග විභාගය (2015)**

**Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Architectural Services (2015)**

මාධ්‍යය : විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

* ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

1.0 පෞද්ගලික තොරතුරු

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදාහරණ : (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදු නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
(උදාහරණ : GUNAWARDHANA. H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.) :————.
2.2 ස්ථිර ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1
පුරුෂ - 0
3.2 ජන වර්ගය ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5
3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3.4 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐
3.5 විවාහක/අවිවාහක බව : ☐
විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.
3.6 දුරකථන අංකය :
ජංගම ☐☐☐☐☐☐☐☐☐☐
ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐
3.7 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

4.0 ගැසට් නිවේදනයෙහි 7 ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තු ශ්‍රේණිවලින් ඔබේ සේවාව හා ශ්‍රේණිය (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් (ඇත්නම්) එය සඳහන් කළ යුතු ය. සුදුසුකම් ලබා දෙන සේවා/ශ්‍රේණි එකකට වැඩි ගණනක ඔබ සේවය කර ඇත්නම් එම සේවා සහ ශ්‍රේණින් දිනයන් සහිතව සඳහන් කළ යුතු ය.) :
4.1 දැනට දරන තනතුර :————.
4.2 තනතුර අයත් සේවය (රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය) :————
4.3 ශ්‍රේණිය :————.
4.4 පන්තිය/ඛණ්ඩය :————.
4.5 තනතුරට පත් වූ දිනය :————.
4.6 එම තනතුරෙහි ස්ථිර කළ දිනය :————.
4.7 උපාධිය ලැබූ දිනය :————.

5.0 ගැසට් නිවේදනයේ 7 ඡේදයේ සඳහන් කර ඇති සේවාවන්/ශ්‍රේණිවල අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ස්ථිර සහ අඛණ්ඩ මුළු සේවා කාලය :————.

6.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

කුවිතාන්සි අංක :————.
ගෙවන ලද කාර්යාලය :————.
දිනය :————.

7.0 අයදුම්කරුගේ සහතිකය ඃ

2015 ...................... මස ........... දිනට පූර්වාසන්නයන් වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණය සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ........... හා ........... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (පෞද්ගලික ලිපි ගොනුවට අනුව) ඃ-

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ............................................ මයා/මිය/මෙය ...................... වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත් වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකමට ඔහු/ඇය භාජනය නොවූ බවද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් සොයාගෙන ඇති බවද, අදාළ ගැසට් නිවේදනයන් හි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බවද, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බවද සහතික කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන)

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

04-289

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 10 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ'' ''ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.05.02 දින වේ.

*සටහන* ඃ ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය ඃ-*

ලිඛිත විභාගයේදී සියළු විෂයන්ට ලකුණු 40ට වඩා ලබාගත් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේදී ලබාගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි ඃ-*

(i) මෙම තනතුර ස්ථිර ය. වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iii) රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතුය.
(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධයන්හි ඇතුළත් කොන්දේසිවලටද, මෙම පත්වීම යටත් වේ.

*03. වැටුප් පරිමාණය* ඃ

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 රු 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *අධ්‍යාපන සුදුසුකම්* ඃ

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීමත ;

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.;

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම.

05. *වයස් සීමාව ඃ-* අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි වීම.

06. *කායික සුදුසුකම්* :

(i) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමටත්,
(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත තරග විභාගයට දෙවතාවකට වඩා පෙනී නොසිටීම.
(v) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන අයෙකු නොවීම.
(vi) දැනට රාජ්‍ය සේවයේ නියැලෙන්නන් හට උපරිම වයස් සීමාව අදළ නොවේ.

08. 8.1 *ලිඛිත විභාගය* :

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
8.1.2 විෂය නිර්දේශය

| *අංකය* | *විෂයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය පැය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40 | 01 |
| 02 | සාමාන්‍ය දැනීම | 100 | 40 | 02 |

විෂය අංක 01 - බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, ගැටලු විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ කුසලතාව විනිශ්චය කිරීම අරමුණ කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරයද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතිය හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් අවබෝධයද පරීක්ෂා කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්න වලින් සමන්විතය. ඒ සඳහා ලකුණු 25කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න 8කින් ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතු අතර ඒ සඳහා ලකුණු 75කි.

8.1.3 *ප්‍රතිඵල නිකුත් කිරීම* ඃ

ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂයින්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ, රාජ්‍ය සේවා කොමිසමේ දැනුම් දීම පරිදි නියම කරන ලද ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

8.2 *සම්මුඛ පරීක්ෂණය :*

8.2.1 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

ලිඛිත විභාගයේදී සියළු විෂයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේදී ලබාගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේදී, නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කරනු ලැබේ. (ලකුණු ලබා දෙනු නොලැබේ.)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීම කරනු ලැබේ.

09. *විභාග කොන්දේසි* ඃ

(i) විභාගය, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.
(ii) විභාග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාලගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදයමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපතෙහි දාරයක් මඟින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. එම කුවිතාන්සිය ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.
(iii) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.
(iv) විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන ඃ- ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

නිවේදනයෙහි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මි. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස්කළ යුතු අතර, 1.0 සිට 2.9 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 2.10 සිට 5.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 3,4 පිටුවලටද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.
(vii) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබා ගෙන, නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.
(viii) මෙම විභාගය 2016 ජූලි මස කොළඹ දී පවත්වනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.
(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.
(x) අපේක්ෂකයාගේ අනන්‍යතාවය ඃ- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.
  (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
  (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

***සැලකිය යුතුය.***—(අ) අයදුම්පතට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(අ) සම්මුඛ පරීක්ෂණයේදී ලියාපදිංචි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(xi) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවාද සහතික කරවාගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමාදන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවාගත යුතුය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* ඃ

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩඇත.

11. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාරණ අමාත්‍යාංශය.

2016 මාර්තු මස 17 වැනි දින.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය (2015)

Open Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Architectural Service (2015)

1.0 මාධ්‍යය ඃ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

* ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු ඃ

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ ඃ (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ ඃ GUNAWARDHANA. H. M. S. K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.5 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ඃ (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.) :————.

2.6 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.7 ස්ත්‍රී/පුරුෂ භාවය (අදළ අංකය කොටුව තුළ ලියන්න.)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

2.8 උපන් දිනය ඃවර්ෂය මාසය දිනය

2.9 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු මාස දින

2.10 තැපැල් නගරය :————.

2.11 ජන වර්ගය (අදළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5

2.12 විවාහක/අවිවාහක බව
විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.13 දුරකථන අංකය

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

2.14 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

3.0 සුදුසුකම් :-
3.1 උපාධිය :————.
3.2 උපාධිය ලද දිනය :————.
3.3 විභාග අංකය :————.
3.4 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

☐

කුවිතාන්සිය :————.
ගෙවන ලද කාර්යාලය :————.
දිනය :————.

5.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න.

6.0 *අයදුම්කරුගේ සහතිකය :-*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ……………………හා …………………… වැනි දන දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 9 (ංස) පරිදි විය යුතුය) :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ………………………………………… (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, …………………… දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරිගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

8.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය නොවන සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………………………………… මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ………………………… ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන)

නම :————.
තනතුර :————.
දිනය :————.
(නිල මුද්‍රාව.)

04-288

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - මීගමුව**

රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මීගමුව මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ දක්වා ඇති රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

01. ටෙන්ඩර් ආකෘති පත්‍ර 2016.04.04 දින සිට 2016.04.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ මීගමුව මහාධිකරණ කාර්යාලයේ දී උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල් ගෙවා රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත හැකි ය.

02. මුද්‍රා තබන ලද මිල ගණන් ඇතුළත් ටෙන්ඩර්පත් අනු පිටපත් සහිතව (මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපත අදාළ ටෙන්ඩර්පත සමග ඉදිරිපත් කළ යුතුය) 2016.04.26 දින ප. ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි ය. ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ වාහන අංකය හා "ටෙන්ඩර් අයදුම්පත 2016" වශයෙන් සඳහන් කළ යුතු ය.

03. ටෙන්ඩර්පත් විවෘත කිරීම ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපිට 2016.04.26 වැනි දින ප. ව. 2.30 ට මීගමුව මහාධිකරණයේ දී සිදු කෙරේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරන ලද අයට හෝ ඔහුගේ/ඇයගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකි ය.

04. මෙම රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රථවාහන ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයට උපලේඛනයේ දක්වා ඇති ස්ථානයේ දී 2016.04.04 දින සිට 2016.04.26 දින දක්වා සතියේ කාර්යාල දිනයන් හි පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා පරීක්ෂා කර බැලිය හැකි ය.

05. නියමිත වේලාවට නොලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර්පත් පිළිබඳ අවසාන තීරණය මීගමුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

ඒ. ඒ. සී. ජේ. රාජරත්න,
මහාධිකරණ විනිසුරු,
සභාපති,
කලාපීය ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය - මීගමුව.

වර්ෂ 2016ක් වූ මාර්තු මස 14 වැනි දින,
මීගමුව මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

***මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ උපලේඛනය***

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන වර්ගය* | *ලි. ප. අංකය* | *රඳවා තබා ඇති ස්ථානය* | *ආපසු ගෙවන ටෙන්ඩර් ගාස්තුව රු.* | *ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | ODD 48632 | බජාජ් ත්‍රී රෝද රථය | SG - AAB 1387 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමිය මිනුවන්ගොඩ | 5,000 | 100 |
| 02. | E 49330 | HERO PLEASURE යතුරු පැදිය | WP - BAT 9578 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමිය මිනුවන්ගොඩ | 5,000 | 100 |
| 03. | E 40862 | HONDA - DIO යතුරු පැදිය | WP - BAF 9344 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමිය මිනුවන්ගොඩ | 5,000 | 100 |

04-222

---

## බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - අනුරාධපුර**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර මහාධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ 2016.05.11 වැනි දින පෙ. ව. 8.30 ට අනුරාධපුර මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන් හි දී අධිකරණයේ අභිමතය පරිදි මෙම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එවේලෙහි ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. ගැණුම් කරුවන් සිය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

මංජුල තිලකරත්න,
මහාධිකරණ විනිසුරු - අනුරාධපුරය.

2016 මාර්තු මස 15 වැනි දින,
අනුරාධපුර මහාධිකරණයේදී ය.

**භාණ්ඩ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| 01. | HC 228/13 | - | කුඩා ප්‍රමාණයේ වාහන ජැක් 01/අමතර රෝද 02 |
| 02. | HC 22/14 | - | ජංගම දුරකථන 01/ලීවරයක්/යකඩ බටයක්/යකඩ කූරක් Wheel Brush 01 |
| 03. | HC 16/14 | - | දැකැති 01 |
| 04. | HC 219/13 | - | කැති 01 |
| 05. | HC 216/13 | - | ඉලෙක්ට්‍රොනික් තරාදි 01 |
| 06. | HC 55/11 | - | කුලු ගෙඩි 01/යකඩ ඉනි 01 |
| 07. | HC 71/11 | - | ස්කුරුප්පු නියන් 01 |
| 08. | HC 96/12 | - | පොරව 01 |
| 09. | HC 152/03 | - | පිහි 01/උදලු 01 |
| 10. | HC 125/13 | - | උදලු 01/උදලු තල 01 /ජංගම දුරකථන 01 |
| 11. | HC 56/11 | - | අංක අපැහැදිලි අබලන් යතුරු පැදි 01/යතුරු පැදියේ කොටස් කිහිපයක් |
| 12. | HC 124/06 | - | කැසට් රේඩියෝ 02/වයර්කොඩ් 01/ඇම්පියර් යන්ත්‍ර 02/ස්පීකර් හෝන් 01/වාහන ජැක් 01/වාහන කණ්ණාඩි 03, වාහන බැටරි 01, අබලන් පාපැදි 01,ස්කුරුප්පු නියන් 01, |
| 13. | HC 56/14 | - | මවුස් 01, මොනිටර් 01, මධ්‍ය සැකසුම් ඒකකය, යතුරු පුවරුව |
| 14. | HC 221/13 | - | මධ්‍ය සැකසුම් ඒකකය, මොනිටර් 01, යතුරු පුවරුව, මවුස් 01, මුද්‍රණ යන්ත්‍ර 01, Pen Drive 01, Scan 01 |
| 15. | HC 40/09 | - | වෑන් රථයක පිටුපස දොර 01 |

04-280

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල**

අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2016.04.30 වැනි දින පෙරවරු 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට කලින් ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගනු ලබන සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර මිලදී ගන්නා භාණ්ඩ සියල්ල එදින පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ප්‍රසන්න අල්විස්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කෑගල්ල.

2016 මාර්තු මස 04 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| 01. | විල්බැරෝ | | | 01 |
| 02. | පුටු කවර (කුෂන් සමග) | | | 05 |
| 03. | එල්ලන කිරුම් තරාදි | | | 01 |
| 04. | පඩි සහිත තරාදි ජෝඩු | | | 02 |
| 05. | Exide බැටරි | | | 02 |
| 06. | ලී පෙට්ටි | | | 02 |
| 07. | නැෂනල් කැසට් රේඩියෝ | | | 02 |
| 08. | Black pearl කැසට් | | | 01 |
| 09. | ගමන් මළු | | | 01 |
| 10. | මේස් ජෝඩු | | | 06 |
| 11. | සපත්තු ජෝඩු | | | 01 |
| 12. | SG වර්ගයේ ටෝස්ටර් | | | 01 |
| 13. | සැම්සුන් වර්ගයේ දුරස්ථ පාලක | | | 01 |
| 14. | අත්මනුව (ජැක්) | | | 01 |
| 15. | කැමරා | | | 04 |
| 16. | ඇලුමිනියම් කල | | | 01 |
| 17. | කුඩ (විශාල වර්ගයේ) | | | 01 |
| 18. | යකඩ බාල්දි | | | 01 |
| 19. | ලොකු බේසම් (ප්ලාස්ටික්) | | | 01 |
| 20. | උණුවතුර බෝතල් | | | 01 |
| 21. | නිපෝන් වර්ගයේ (හිටවන ෆෑන්) | | | 01 |
| 22. | කුඩා ප්‍රමාණයේ සපත්තු ජෝඩු | | | 01 |
| 23. | ප්ලාස්ටික් බූලි | | | තොගය |
| 24. | ප්ලාස්ටික් කෑන් | | | තොගය |
| 25. | වීදුරු බෝතල් | | | තොගය |
| 26. | ප්ලාස්ටික් බැරල් | | | තොගය |
| 27. | යකඩ බැරල් | | | තොගය |
| 28. | රබර් හෝස් | | | තොගය |
| 29. | සෙරමික් වර්ගයේ සින්ක් | | | 01 |
| 30. | හෙල්මට් | | | 01 |
| 31. | ප්ලාස්ටික් ලොකු බාල්දි | | | 03 |
| 32. | මොනිටර් (CNC 74805 KY) | | | 01 |
| 33. | මොනිටර් (CNC 74805 LM) | | | 01 |
| 34. | UPS (437 B 21434) | | | 01 |
| 35. | UPS (437 B 21435) | | | 01 |
| 36. | පින්ටර් (5994 RF 31 - E 120 N) | | | 01 |
| 37. | FAX (F7R 955834) | | | 01 |
| 38. | FAX (D7F 205003) | | | 01 |
| 39. | 38109 | | ගෑස් සිලින්ඩර් | 01 |
| | | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 40. | 19136/13 | | 133- 4321 දරන කවසාකි වර්ගයේ යතුරු පැදි | 01 |
| 41. | 8899/14 | | WPUY 7941 බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදි | 01 |
| 42. | AR7450/14 | | WPMP 9934 පල්සර් (බජාජ්) යතුරුපැදි | 01 |
| 43. | 37603/16 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 44. | 35741/15 | | ගෑස් ලිප සමග රෙගියුලේටරය | 01 |
| 45. | 13674/12 | | ගෑස් ලිප් සමග රෙගියුලේටරය | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 46. | 4606/12 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 47. | 33807/15 | | ගෑස් ලිප සමග සිලින්ඩර් | 01 |
| 48. | PR 195/15 | | ගෑස් ලිප් | 01 |
| 49. | 31470/15 | | චේන් සෝ | 01 |
| 50. | 33281/15 | | චේන් සෝ | 01 |
| 51. | 34858/15 | | අත්ට්‍රැක්ටර්<br>(බී. 8658/15) | 01 |
| 52. | 33865/15 | | අත් ට්‍රැක්ටර් | 01 |
| 53. | AR 8330/14 | | පාපැදි | 01 |
| 54. | 36641/15 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 55. | 12606/12 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 56. | 26867/14 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 57. | 35085/15 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 58. | 33327/15 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 59. | 36787/15 | | අත්ට්‍රැක්ටර් | 01 |
| 60. | 31231/15 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 61. | 33779/15 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 62. | 35011/15 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 63. | 33236/15 | (i) | ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 64. | 35729/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 65. | 33664/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 66. | 37336/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 67. | 6728/11 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 68. | 29874/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 69. | 30444/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 70. | 35576/15 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 71. | 37810/16 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 72. | 21974/13 | | ගෑස් සිලින්ඩර් | 01 |
| 73. | 25031/14 | | අංක රහිත (KINETIC) වර්ගයේ<br>යතුරු පැදි | 01 |
| 74. | AR 8181/14 | | 154-0822 (කවසාකි) යතුරුපැදි | 01 |
| 75. | AR 9093/15 | | බජාජ් (පල්සර් VG - 5718) යතුරුපැදි | 01 |
| 76. | AR 8898/14 | | WPTS 5892( සියාග්‍රා) යතුරුපැදි | 01 |
| 77. | AR 8011/14 | | EPJG 1722 බජාජ් පල්සර් යතුරුපැදි | 01 |
| 78. | AR 7335/14 | | (ලොංසින් වර්ගයේ SG -HA 6479 යතුරුපැදි | 01 |
| 79. | 62617/06 | | (හොන්ඩා CD 125) යතුරුපැදි | 01 |
| 80. | 29447/15 | | WPJD 4310 (ලොංසින්) වර්ගයේ<br>යතුරුපැදි | 01 |
| 81. | 36114/15 | (i) | ෆිල්ටර් | 02 |
| | | (ii) | පීඩන පොම්ප | 01 |
| | | (ii) | ෆ්ලෑෂ් ලයිට් | 02 |
| | | (iv) | කුඩා මෝටර් | 01 |
| | | (v) | දැව ලෑලි බංකු | 01 |
| 82. | ටයිපින් පුටු | | | 05 |
| 83. | අබලි වී ගිය අල්මාරියක ලී කැබලි | | | |
| 84. | යතුරු ලියන (ඉංග්‍රීසි) | | | 01 |
| 85. | යතුරු ලියන (සිංහල) | | | 01 |
| 86. | විදුලි පන්දම් | | | 01 |
| 87. | ජංගම දුරකථන චාජර් | | | 01 |
| 88. | 38033/16 | | ජලකරාම | 01 |
| 89. | 38029/16 | | ජලකරාම | 01 |
| 90. | 38022/16 | | ජලකරාම | 01 |
| 91. | 37861/16 | | ජලකරාම | 01 |
| 92. | 2758/09 | | ලොකු කුඩ | 01 |
| 93. | 23758/14 | | යකඩ බාල්දි | 01 |
| 94. | 36144/15 | | ගෑස් ලිප | 01 |
| 95. | 15417/12 | | ගෑස් ලිප | 01 |
| 96. | 18123/13 | | ලොකු බේසම් | 01 |
| 97. | 17364/11 | | ප්ලාස්ටික් ලොකු බාල්දි | 02 |
| 98. | 34377/15 | | යකඩ බාල්දි | 01 |
| 99. | 31652/15 | | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 100. | 31614/12 | | මිට රහිත සවල් | 01 |
| 101. | 31693/15 | | විදුලි පැස්සුම් | 01 |
| 102. | AR 10816/15 | | සවල් | 01 |
| 103. | 32357/15 | | සවල් | 01 |
| 104. | 32358/15 | | සවල් | 01 |
| 105. | 31455/05 | | සවල් | 01 |
| 106. | AR 8532/14 | | Forme වර්ගයේ දුරකථන | 01 |
| 107. | AR 8531/14 | | MICROMAX වර්ගයේ දුරකථන | 01 |
| 109. | AR 8531/14 | | NOKIYA වර්ගයේ දුරකථන | 01 |
| 110. | 5785/13 | | NOKIYA වර්ගයේ ජංගම දුරකථන | 01 |

04-186

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය -මාතලේ

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාල රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් හා 2015 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වෙන්දේසි කිරීම සඳහා නිර්දේශිත භාණ්ඩ 2016.0430 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව කිසිවෙකු අයිතිවාසිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින හෝ ඊට පෙර මෙම අධිකරණය වෙත ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු වන අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන තැනැත්තන් අනිවාර්යයෙන් ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

රවීන්ද්‍ර ප්‍රේමරත්න,
දිසා විනිසුරු,
මාතලේ.

2016 මාර්තු මස 10 වැනි දින,
මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### ප්‍රසිද්ධ වෙන්දේසිය - 2016

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | B. 157/05 | අංක 32-5840 දරන මහේන්ද්‍රා වර්ගයේ ජීප් රථය (අබලි ද්‍රව්‍ය ලෙස)<br>චැසි අංකය : DL - 24905<br>එන්ජින් අංකය : DL - 24905 | 01යි |
| 02. | 20644<br>B 719/13 | අංක 17 - 6743 දරන බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය (අබලි ද්‍රව්‍ය ලෙස)<br>චැසි අංකය : F 24 BJ - 011867<br>එන්ජින් අංකය : M - 24BH - 012725 | 01යි |
| 03. | 95225<br>B 454/09 | අංක CPGV 6399 දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : DD FBJE 52308<br>එන්ජින් අංකය : DDMBJE 58295 | 01යි |
| 04. | 94840<br>B 542/10 | අංක 145 - 8362 දරන සුසුකී වර්ගයේ යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස)<br>එන්ජින් අංකය : RG 125 T - 109136 | 01යි |
| 05. | AR 203/11 | අංක NWMG - 3735 දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : FDCB LL 74243<br>එන්ජින් අංකය : FDEBLL 75599 | 01යි |
| 06. | AR 305/12 | අංක CPHI - 8576 දරන බජාජ් වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : DFFBKC 23013<br>එන්ජින් අංකය : DMMBKC 09120 | 01යි |
| 07. | AR 686/12 | අංක EPMF - 0104 දරන කින්ටෙක් වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : GB 68000825<br>එන්ජින් අංකය : GA 68000779 | 01යි |
| 08. | AR 71/13 | ලියාපදිංචි නොකළ හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස)<br>චැසි අංකය : 04627 F35986<br>එන්ජින් අංකය : 04H27 E24058 | 01යි |
| 09. | AR 1651/13 | ලියාපදිංචි නොකළ මොපේඩ් වර්ගයේ යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස)<br>චැසි අංකය : LYWXCBLB 16A 118092<br>එන්ජින් අංකය : 1P39FMB 16 F 118092 | 01යි |
| 10. | AR 1399/14 | NWHK 5635 දරන ටී.වී. එස්. වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : N 3307 F 594567<br>එන්ජින් අංකය : N 3307M 597119 | 01යි |
| 11. | AR 272/15 | CPTS 2736 දරන හීරෝ හොන්ඩා වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : MB3KC12EB7GF00333<br>එන්ජින් අංකය : 07 FBMM 04206 | 01යි |
| 12. | 1701 | අංක රහිත සීෆැන් වර්ගයේ රොටරිය සහිත අත් ට්‍රැක්ටරය (78-2479)<br>චැසි අංකය : 5338<br>එන්ජින් අංකය : 1486 (අපැහැදිලි) | 01යි |
| 13. | 11376 | අංක රහිත රොටරිය සහිත අත් ට්‍රැක්ටරය (ලියාපදිංචි නොකළ) (අබලි ද්‍රව්‍ය ලෙස)<br>චැසි අංකය : SYT - 0148<br>එන්ජින් අංකය : SYT - 0148 | 01යි |
| 14. | B 120/15 | අංක රහිත යන්මාර් වර්ගයේ අත් ට්‍රැක්ටරය 74 - 5963<br>චැසි අංකය : 010423<br>එන්ජින් අංකය : 006951 | 01යි |
| 15. | 90263<br>B192/10 | ATLES වර්ගයේ අංක LD08041488 පා පැදිය | 01යි |
| 16. | AR 1640/13 | SANEAGLE වර්ගයේ අංක 0353866 දරන පා පැදිය | 01යි |
| 17. | AR 303/12 | අංක 8481915 දරන ඒෂියා වර්ගයේ පා පැදිය | 01යි |
| 18. | AR 257/12 | යාන්ත්‍රික දම්වැල් කියත් | 01යි |
| 19. | 5376<br>B467/12 | යාන්ත්‍රික දම්වැල් කියත්<br>මැෂින් චේන්<br>රවුම් පීරිතල | 01යි<br>04යි<br>06යි |
| 20. | 25130<br>B 1563/11 | යකඩ ඇඳන් | 01යි |
| 21. | 51821<br>B194/03 | විවිධ ප්‍රමාණයේ ඇස්බැස්ටෝස් ෂීට් | 29යි |
| 22. | 18530<br>B239/13 | යකඩ ග්‍රිල් | 10යි |
| 23. | 86504<br>B521/09 | විවිධ ප්‍රමාණයේ කළු පැහැති යකඩ ග්‍රිල් | 03යි |
| 24. | 82489<br>B784/08 | නිල්පාට යකඩ කපන කතුරු | 01යි |
| 25. | AR 250/15 | තඹ අඩංගු බෑග් | 01යි |
| 26. | AR 302/15 | තඹ අඩංගු පාර්සල් (රෝලක්) | 01යි |
| 27. | 88563<br>B 803/09 | කම්බි අඩංගු බෑග් | 01යි |
| 28. | B1556/12 | විවිධ ප්‍රමාණයේ හතරැස් බට තොගයක්<br>වාහන එන්ජින්වල සෙව් ගෙඩි<br>මෝටර් සයිකල් රිම්<br>වාහන රිම්<br>ඇක්සල්<br>ඔක්සිජන් සිලින්ඩර්<br>යකඩ කූරු<br>එල් අයිරින් කැබලි<br>කුඩා සිලින්ඩර් කොටස් | <br>09යි<br>01යි<br>02යි<br>01යි<br>01යි<br>06යි<br>03යි<br>04යි |
| 29. | 5145<br>B 1379/11 | රිම් එක සහිත ත්‍රිරෝද රථ ටයර් | 01යි |
| 30. | 98042<br>B 245/10 | ත්‍රිරෝද රථ ටයර් | 01යි |
| 31. | අංක රහිත | කාර් රථ ටයර්<br>කාර් රථ බැටරි | 01යි<br>01යි |
| 32. | 87190 | කළුපාට බෆල් (ලොකු) | 02යි |
| 33. | 25130<br>B 1563/11 | DVD යන්ත්‍ර | 01යි |
| 34. | 86502<br>B 181/09 | කළුපාට කැසට් රේඩියෝව | 01යි |
| 35. | AR<br>1043/14 | Pioneer වර්ගයේ වාහන කැසට් යන්ත්‍රය හා එහි දුරස්ථ පාලකය | 01යි |
| 36. | AR 656/15 | කෙන්වුඩ් වර්ගයේ ලිප් දෙකකින් යුත් අවන් එක සහ කෝඩ් වයරය | 01යි |
| 37. | 21216<br>B 729/12 | 50 kg ප්‍රමාණයේ සංස්ථා යූරියා මිටි<br>සංස්ථා ටී. එස්. පී. 50kg ප්‍රමාණයේ මිටි<br>සංස්ථා ටී. එස්. පී. 40kg ප්‍රමාණයේ මිටි<br>සංස්ථා. ටී. එම්. බී. ජී. රතු 50 kg ප්‍රමාණයේ මිටි<br>යූරියා 12kg ක් අඩංගු බෑග්<br>එම්. ඕ. පී. රතු කුඩු 32kg අඩංගු බෑග් | 02යි<br>01යි<br>01යි<br>01යි<br>01යි<br>01යි |
| 37. | 33005 | ප්ලාස්ටික් බාල්දි | 01යි |
| 38. | 32878 | ප්ලාස්ටික් බාල්දි | 01යි |
| 39. | 33283 | ප්ලාස්ටික් බාල්දි | 01යි |
| 40. | 33289 | ප්ලාස්ටික් බාල්දි | 01යි |
| 42. | 99928 | ප්ලාස්ටික් කළගෙඩි | 01යි |
| 43. | AR<br>1115/14 | අත් කියත් | 01යි |
| 44. | 97577<br>B 390/11 | අත් කියත් | 01යි |
| 45. | 18979 | බයිසිකල් චේන් | 01යි |
| 46. | 25470 | ජංගම දුරකථන<br>බෙල්ට්<br>සපත්තු ජෝඩු<br>පර්ස් | 01යි<br>01යි<br>01යි<br>01යි |
| 47. | 33357 | පර්ස් | 01යි |
| 48. | 81217 | කැල්කියුලේටර් | 01යි |
| 49. | 30745 | උණුවතුර බෝතල් | 01යි |
| 50. | 94840<br>B 542/10 | අල්ෆාටෙල් වර්ගයේ ජංගම දුරකථන<br>මොඩ්ල් අංක 72 දුඹුරුපාට ජංගම දුරකථන | 01යි<br>01යි |
| 51. | 91128<br>B 482/10 | සිග්මා ටෙල් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 52. | 86120 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 53. | 93131 | ඉස්කුරුප්පු නියන්<br>ප්ලග්<br>වාහන ගැලවීමට ගන්නා යතුරු | 01යි<br>01යි<br>01යි |
| 54. | 86065<br>B 527/09 | දුනු තරාදි | 01යි |
| 55. | 25886 | උදළු | 01යි |
| 56. | 30877 | උදළු | 01යි |
| 57. | 19875 | උදළු | 01යි |
| 58. | 27309 | උදළු | 01යි |
| 59. | AR 413-15 | සවල් | 02යි |
| 60. | 94695 | සවල් | 01යි |
| 61. | 94978 | සවල් | 01යි |
| 62. | 96190 | සවල් | 01යි |
| 63. | 31664 | සවල් | 01යි |
| 64. | 95429 | සවල් | 01යි |
| 65. | 28642 | සවල් | 01යි |
| 66. | 28644 | සවල් | 01යි |
| 67. | 26428 | සවල් | 01යි |
| 68. | 32123 | සවල් | 01යි |
| 69. | 22078 | සවල් | 01යි |
| 70. | 22080 | සවල් | 01යි |
| 71. | 26429 | සවල් | 01යි |
| 72. | 25021 | සවල් | 01යි |
| 73. | 34948 | සවල් | 01යි |
| 74. | 95429 | යකඩ බාල්දි | 01යි |
| 75. | 31811 | යකඩ බාල්දි | 01යි |
| 76. | 28644 | යකඩ බාල්දි | 01යි |
| 77. | 8252 | යකඩ බාල්දි | 01යි |
| 78. | 8254 | යකඩ බාල්දි | 01යි |
| 79. | 34948 | ප්ලාස්ටික් තාච්චි | 01යි |
| 80. | AR 1668/12 | යකඩ තාච්චි | 02යි |
| 81. | 30875 | යකඩ කූරු | 01යි |
| 82. | 26008 | යකඩ කූරු | 01යි |
| 83. | 30872 | යකඩ කූරු | 01යි |
| 84. | AR 966/14 | යකඩ කූරු | 01යි |
| 85. | 935 | යකඩ කම්බි කූරු | 01යි |
| 86. | AR 1652/13 | යකඩ පොලු | 01යි |
| 87. | 31906 | යකඩ උල් | 01යි |
| 88. | B 194/15 | යකඩ උල් | 01යි |
| 89. | B 186/15 | යකඩ උල්<br>යකඩ ඇණ | 01යි<br>01යි |
| 90. | 6218 | ඇලුමිණියම් මුට්ටි | 01යි |
| 91. | 6219 | ඇලුමිණියම් මුට්ටි | 01යි |
| 92. | 6220 | ඇලුමිනියම් මුට්ටි | 01යි |
| 93. | අංක රහිත | ඇලුමිණියම් පාත්‍ර | 01යි |
| 94. | AR 118/15 | පිත්තල සෙම්බු | 01යි |
| 95. | 24487<br>B442/14 | පිහියා | 01යි |
| 96. | 31013 | පිහියා | 01යි |
| 97. | 89779<br>B1063/08 | පිහියා | 01යි |
| 98. | 1626<br>B540/11 | මේස පිහියා | 01යි |
| 99. | 97327<br>B341/11 | පිහියා | 01යි |
| 100. | අංක රහිත | ටකරන් තහඩු තොගයක් | |
| 101. | අංක රහිත | තඹ දඟර තොගයක් | |
| 102. | අංක රහිත | විශාල හා කුඩා ප්‍රමාණයේ යකඩ බැරල් තොගයක් | |
| 103. | අංක රහිත | කළු පැහැති අඟල් 02 ප්‍රමාණයේ ප්ලාස්ටික් බට | 02යි |
| 104. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ අරක්කු, බියර් බීම රඳවන | 25යි |
| 105. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | |
| 106. | අංක රහිත | ප්ලාස්ටික් කෑන් තොගයක් | |

### 2015 භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසියට නියම කරන ලද භාණ්ඩ

ඇඳි සහිත ලී පුටු (වේවැල් වියන ලද) 07යි
ඇඳි රහිත පුටු 04යි
ඇඳි සහිත බංකු 02යි
ඇඳි රහිත යකඩ පුටු 01යි
හැකිලිය හැකි යකඩ පුටු 01යි
ඇඳි රහිත යකඩ ප්‍රේම් සහිත කුෂන් පුටු 02යි
ලියුම් පෙට්ටි (කැඩී ගිය) 01යි
ලී මේසයක ලාච්චු 01යි
වානේ මේස 01යි
අල්මාරි පියන් (දැල් සහිත) 21
ටියුබ් බල්බ රඳවන තොගයක්

04-230

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

හෝමාගම දුම්රියපල පාර, අංක 31 හි පදිංචි කුරුප්පු අච්චිගේ චන්දන කුමාර වන මම ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් අදාළ සියලු දෙනාටත්, මෙයින් දන්වා සිටින වගනම් මා විසින් අත්සන් කර දෙන ලද හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඇම්. යූ. බණ්ඩාර මහතා විසින් 2015 මාර්තු මස 30 වැනි දින සහතික කරන ලද අංක 07 දරන ඇටර්නි බලපත්‍රයෙන් මගේ ඇටර්නි බලකරු ලෙසට කොළඹ 01 එච්ලින්ස්කෙයර් ලෝක වෙළඳ මධ්‍යස්ථානය නැගෙනහිර කුළුණ අංක 26 සහ 34 හි ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන වයිට් හෝස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගුකර/ප්‍රත්‍යාදිෂ්ඨ කරමි. 2016.01.15 දිනයේ පටන් එකී ඇටර්නි බලපත්‍රය යටතේ සිදුකරන කිසිම ක්‍රියාවක්, ගනුදෙනුවක් කෙරෙහි මගේ වගකීමක්, බැඳීමක් නොමැති බව දන්වා සිටිමි.

කුරුප්පු අච්චිගේ චන්දන කුමාර.

04-40

---

### සංස්ථාගත කිරීමක් පිළිබඳ නිවේදනය

සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමී වශයෙනි.

සමාගමේ නම : ඩයමන්ඩ් ක්ලීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111218
ලියාපදිංචි ලිපිනය : අංක 165, මහින්ද මාවත, හාවාඑළිය, නුවරඑළිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්ටීපී බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 324/1ඒ, ගාලු පාර, කොළඹ 03.

04-48

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, වත්තේගම, යටිරාවන, අංක 26/A හි පදිංචි සෙසුනායිදු ජයන්ති කුමාරි (ජා. හැ. අංක 645443403 V ) වන මා ප්‍රසිද්ධ නොතාරිස් රත්නායක වාසල මුදියන්සේලාගේ බන්දුල විජය බණ්ඩාර රත්නායක, මහතා විසින් වර්ෂ 2005ක් වූ නොවැම්බර් මස 09 වැනි දින ලියා සහතික කළ අංක 10472 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් වත්තේගම යටිරාවන අංක 388 හි පදිංචි සියමුදලි මුදියන්සේලාගේ හින්නිහාමිගේ යන අය වෙත පවරණ ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2016ක් වූ මාර්තු මස 10 වැනි දින පටන් මෙයින් වලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

සෙසුනායිදු ජයන්ති කුමාරි.

2016 මාර්තු මස 08 වැනි දින.

04-49

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, වත්තේගම, යටිරාවණ, අංක 26/A හි පදිංචි සෙසුනායිදු ජයන්ති කුමාරි (ජා. හැ. අංක 645443403 V) වන මා ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්ලිව්. එම්. බී. ඩබ්ලිව්. බී. රත්නායක මහතා විසින් වර්ෂ 2004ක් වූ මාර්තු මස 22 වැනි දින ලියා සහතික කළ අංක 8969 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් වත්තේගම යටිරාවණ අංක 388 හි පදිංචි සියමුදලි මුදියන්සේලාගේ හින්නිහාමිනේ යන අය වෙත පවරණ ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2016ක් වූ මාර්තු මස 10 වැනි දින පටන් මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

සෙසුනායිදු ජයන්ති කුමාරි.

2016 මාර්තු මස 08 වැනි දින.

04-50

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි.

නම : වෝල් ඩෙකෝ ඉන්ටීරියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 106895
දිනය : 2015.08.31
ලිපිනය : අංක 34/1, රෝහණ මාවත, සුබූතිපුර, බත්තරමුල්ල.

නම : මිෂිමා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 109438
දිනය : 2015.10.29
ලිපිනය : 845 ඊ, දෙඩම්ගහහේන, ගොතටුව නව නගරය, අයිඩීඑච්.

නම : ඇවෙන්රිච් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 108991
දිනය : 2015.10.09
ලිපිනය : අංක 6/4/A, මාකොළ දකුණ, මාකොළ.

නම : සිරිලක් සී ෆුඩ් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංක : P V 75218
දිනය : 2010.10.02
ලිපිනය : අංක 260/F 2, ඩෙන්සිල්කොබ්බෑකඩුව මාවත, තලංගම උතුර, බත්තරමුල්ල.

නම : සිරිලක් සුපර් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංක : P V 78530,
දිනය : 2011.04.28
ලිපිනය : අංක 262/F 2, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, තලංගම උතුර, බත්තරමුල්ල.

නම : සිරිලක් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : P V 95308,
දිනය : 2013.10.31
ලිපිනය : අංක 171, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, තලංගම උතුර, බත්තරමුල්ල.

නම : චාඕ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 108891,
දිනය : 2015.10.13
ලිපිනය : අංක 36, පාගොඩ පාර, නුගේගොඩ.

නම : ඔටෝලක් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : P V92195,
දිනය : 2013.04.23
ලිපිනය : අංක 233, හිල් ස්ට්‍රීට්, දෙහිවල.

නම : නොබල් ඇපරල් වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 110388,
දිනය : 2015.12.10
ලිපිනය : සෙලින්කෝ බැංකුව පසුපස මීගමුව පාර, මරදගහමුල.

නම : රෙයිෂ් ට්‍රේඩිං සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : P V 11137,
දිනය : 2016.01.11
ලිපිනය : අංක 242/22, ඕපල් පාර්ක්, ජිනරතන මාවත, බටකැත්තර, මඩපාත.

සමාගම් ලේකම්වරු.

04-51

### පොදු නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 ජේදයේ නියමයන්ට අනුකූලව ''එස් කැලණිතිස්ස (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය ''සෝජිට්ස් කැළණිතිස්ස (ප්‍රයිවට්) ලිමිටඩ්'' වශයෙන් වෙනස් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) ජේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින්වූ නාමය : එස් කැළණිතිස්ස (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 5758
ලියාපදිංචි කාර්යාලය : 28, නව කැළණි පාලම පාර, වැල්ලම්පිටිය
සමාගමේ නව නාමය : සෝජිට්ස් කැළණිතිස්ස (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ග්‍රෑප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.
2016 මාර්තු මස 07 වැනි දින.

04-52

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම 2016 මාර්තු මස 09 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඔලිව් ලැබ්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 112321
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ''සේනානි'', හෙට්ටියාවල, පුහුල්වැල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

04-55

---

### සංස්ථාපනය කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය.

සමාගමේ නම : ඉන්ඩල්ජ් ලංකා ට්‍රැවල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104477
සංස්ථාපනය කිරීමේ දිනය : 2015 මාර්තු 17
ලියාපදිංචි කාර්යාලය : අංක 237/2, ගාලු පාර, ගල්කිස්ස.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-90

---

### සංස්ථාපනය පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඇම්බ්‍රස්ඩන් රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108133
සංස්ථාගත කළ දිනය : 2015.09.04
ලියාපදිංචි ලිපිනය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-91

---

### සංස්ථාපනය පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය.

සමාගමේ නම : සනුර් මිනරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108729
සංස්ථාගත කළ දිනය : 2015.09.29
ලියාපදිංචි කාර්යාලය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-92

---

### සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : කිල්සිකි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 108081
සංස්ථාගත කළ දිනය : 2015.09.01
ලියාපදිංචි ලිපිනය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-93

---

### සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සෙනුර් ඒෂියා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108517
සංස්ථාගත කිරීමේ දිනය : 2015.09.21
ලියාපදිංචි කාර්යාලය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-94

---

### සංස්ථාපනය පිළිබඳව කරනු ලබන නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : මෙල්විලි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108332
සංස්ථාගත කළ දිනය : 2015.09.11
ලියාපදිංචි ලිපිනය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-95

---

### සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : මෙල්විලී රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108396
සංස්ථාගත කිරීමේ දිනය : 2015.09.18
ලියාපදිංචි ලිපිනය : 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-96

---

### සමාගමේ නම වෙනස්වීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය අනුව 2015 දෙසැම්බර් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත සඳහන් සමාගමේ නම ( 8 වගන්තිය අනුව) වෙනස් කළ බවට කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනය.

සමාගමේ කලින් තිබූ නම : බෆලෝ සිමෙන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 101152
ලියාපදිංචි ලිපිනය : අංක 38 ඒ, ඉහලගම, ගම්පහ
සමාගමේ නව නාමය : බ්ලූ ඩයමන්ඩ් රිසෝට් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-97

---

### සමාගමක නමක් වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමෙහි නම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුගාමීව 2015 ජුනි 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කරන ලද බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ කලින් තිබූ නම : ප්‍රින්ටොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85596
ලිපිනය : අංක 1630, කොටා පාර, රාජගිරිය
නව නාමය : ඇක්වා ෆ්ලෙක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-98

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

බොරලැස්ගමුව රොස්ටන් උද්‍යානයේ 275/1/28 රාමනායක මුදියන්සේලාගේ සුනිල් රංජිත් වන මා බණ්ඩාරවෙල ප්‍රධාන වීදියේ 64 හි රාමනායක මුදියන්සේලාගේ සරත් වෙත දෙනලද බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. එස්. වීරසිංහ සහතික කළ අංක 2017 සහ 2012 සැප්තැම්බර් මස 11 දිනැති ඇටර්නි බලපත්‍රය 2015.10.20 සිට අවලංගුවන බව මෙයින් දන්වමි.

ආර්. එම්. සුනිල් රංජිත්.

04-99

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අඟුලාන, පොදු ජය මාවතේ, අංක 51 දරන තැන පදිංචි දසනායක මුදියන්සේලාගේ සංජය ලසන්ත විජේසිංහ වන මම, කළුතර ප්‍රසිද්ධ නොතාරිස් දිලානි ජයනෙත්ති මහත්මිය විසින් වර්ෂ 2014ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දින සහතික කරන ලද අංක 09 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ, පානදුර කෙසෙල් වත්ත, සුභද්‍රාරාම මාවතේ, අංක 18 දරන ස්ථානයේ පදිංචි මුතා මෙරෙන්නගේ නලනි ප්‍රියංගිකා නමැති අයට ලබා දුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත් සියලු මහජනතාවනුත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් බාරගනු නොලබන බව ද සියලු දෙනා ම මෙයින් දැන ගනිත්වා.

දසනායක මුදියන්සේලාගේ සංජය ලසන්ත විජේසිංහ.

04-106

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සංස්ථාගත කළ දිනය : 2016.02.11
නම : රේමන්ඩ් ලංකා ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 111831
ලියාපදිංචි ලිපිනය : අංක 04, රිචඩ් ද සොයිසා මාධ්‍ය නිවාස සංකීර්ණය, කොස්වත්ත, බත්තරමුල්ල (ලේකම්වරුන්ගේ ලිපිනය)

කළම්බු කෝපොරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරු.

04-110

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිළියන්දල, කැස්බෑව, හොරණ පාරේ, ''ජයසුමන'' අංක 62 හි පදිංචි සහ ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා, හැම්ප්ටන් පාක්, 3976, ජෙනරල් ජොෂුවා ඩ්‍රයිව්, අංක 28 හි පදිංචි මුතුකුඩ ආරච්චිගේ නිලාන් සුජීව පෙරේරා (ජා. හැ. අංක. 652742246 V) යන අය විසින් පියදස හේවාලංකාර ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ වසර 2010ක් වූ ඔක්තෝබර් මස 08 වැනි දින සහ අංක 1540 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් අංක 62, ''ජයසුමන'' හොරණ පාර, කැස්බෑව, පිළියන්දල පදිංචි වාසල තන්ත්‍රී සුමනාවති ගුණවර්ධන (ජා. හැ. අංක 356020839 V) හිමිකාරිය වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2016 ජනවාරි මස 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවත්, ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට වාසල තන්ත්‍රී සුමනාවතී ගුණවර්ධන විසින් එකී ඇටෝර්නි බලකරු ලෙස සිදු කරන ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

මුතුකුඩ ආරච්චිගේ නිලාන් සුජීව පෙරේරා.

2016ක් වූ ජනවාරි මස 31 වැනි දී ය.

04-111

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීම

අංක 227/G දේවාලය පාර, බෝපිටිය, පමුණුගම ලිපිනයේ පදිංචි විජේසිංහ මුදියෙන්සේලාගේ සෝමපාල හා සින්නතුරෙයි සෝමපාල සිවමලර් මහත්මිය වන අයවලුන් විසින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. රමේෂ්කුමාර් මහතා විසින් 2011.07.09 වැනි දින ලියා සහතික කරන ලද රත්නපුර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර පොතේ අංක 07 වැනි කාණ්ඩයේ 03 වැනි පත් ඉරුවේ අංක 233 දරන දින පොතේ අංක 665 යටතේ වර්ෂ 2011.07.15 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2016.02.05 වැනි දින සිට අවලංගු හා බල රහිත ශූන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස දන්වන අතර, එකී බලපත්‍රය යටතේ මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් අංක 29/7, මයිලගස්තැන්න, බදුල්ල යන ලිපිනයේ පදිංචි සුප්පයියා රදී මහත්මිය (ජාතික හැඳුනුම්පත් අංක 705923388 V) යන අයට මා වෙනුවෙන් ක්‍රියා කිරීමට ලබා දී ඇත්තාවූ බලය වර්ෂ 2016.02.05 වැනි දින සිට අහෝසි වන බව සියලු දෙනාම දැනගත යුතු වේ.

විජේසිංහ මුදියන්සේලාගේ සෝමපාල
සින්නතුරෙයි සෝමපාල සිවමලර්.

2016 පෙබරවාරි මස 05 වැනි දින.

04-120

### නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ජමී කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 97109
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 596/35, නිව් ටවුන්, ස්ටේජ් 01, අනුරාධපුර
සමාගම ලියාපදිංචි කළ දිනය : 2014.02.18

04-133

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාපනය කිරීමෙන් පසු කරන දැන්වීම්

සමාගමේ නම : පිජන් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111338
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40, ගැමුණු මාවත, හන්තාන ප්ලේස්, ගුරුදෙණිය.

සමාගමේ නම : ඒ. ඒ. ආර්. ස්ටීල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 78466
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 21, මඩවල පාර, කටුගස්තොට.

සමාගමේ නම : ජේ. ඊ. සී. කැන්ඩි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111945
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 123, බහිරව කන්ද පාර්ත්, අස්ගිරිය, මහනුවර.

සමාගමේ නම : අන්ගාරා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112069
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 90, මහවැලි උයන, නව නගරය, කුණ්ඩසාලේ.

සමාගමේ නම : හේමචන්ද්‍රස් චයිනා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111941
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 454/23, පියාෂෝ ගාර්ඩ්න්ස්, මහනුවර.

සමාගමේ නම : එල්. ටී. ඩී. එස්. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111801
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 7, බදුවත්තලේන්, ලේවැල්ල, මහනුවර.

සමාගමේ නම : හොල්බොන්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112088
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 7, ''අදිකාරි'', ගනේගොඩ, වැඋඩ.

සමාගමේ නම : වොන්ටොප් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111783
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 6, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, ගලගෙදර මඩිගේ, ගලගෙදර.

සමාගමේ නම : ත්‍රිලෝක ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63969
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 166, ගුරුදෙණිය, මහනුවර.

සමාගමේ නම : සේජ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111693
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 276කේ, මවුන්ට් පැරඩයිස් ලේන් 2, මාලිගාතැන්න, ගුරුදෙණිය, මහනුවර.

සමාගමේ නම : සෙත්මිල ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102147
සමාගමේ ලියපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 159/ජී, ජයන්ති පාර, හල්ඔළුව.

ජේ. සී. විජේතුංග,
සමාගම් ලේකම්.

අංක 430, නීතිඥ කාර්යාල සංකීර්ණය,
මහනුවර.
081- 2388835

04-138

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඉකෝ රෙවලූෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 99974
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 51/ඒ, කොළඹ පාර, පොල්ගහවෙල
ලියාපදිංචි දිනය : 2014.07.30

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

04-139

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ටෙක්වයර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105133
ලියාපදිංචි ලිපිනය : අංක 73, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සමාගම් ලේකම්.

04-140

---

### සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

ඇලුමෙක්ස් පීඑල්සී
(සමාගම් අංකය පී වී 539 පීකිව්)
සහ
ඇව්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(සමාගම් අංක පී වී 62664)

ඇලුමෙක්ස් පීඑල්සී (සමාගම් අංක පී වී 539 පී කිව්) සහ ඇව්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී වී 62664) යන සමාගම් ද්විත්වය 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3) b වැනි ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය ඇලුමෙක්ස් පීඑල්සී වන අතර, මෙම ඒකාබද්ධය බල ගැන්වෙනු ලබන්නේ 2016 අප්‍රේල් මස 20 වැනි දින හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් අනුමත කරන දිනයක දී විය හැක.

ඒකාබද්ධවීමෙන් පසු ඇලුමෙක්ස් පීඑල්සී සමාගමේ ලියාපදිංචි කාර්යාලය, සපුගස්කන්ද, මාකොළ පිහිටුවනු ලැබේ.

සමාගම් පනතේ 242 (4) වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමක් අනුමත කරන යෝජනා සම්මුති එක්ව ගත්කළ, අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉන් සජ්ජිත වන්නේ යයි සලකනු ලැබිය යුතු ය. එම යෝජනාව ඒකාබද්ධ කෙරෙන සමාගම් හි ඕනෑම කොටස්හිමියෙකුට, ණයහිමියෙකුට හෝ ඒ සඳහා බැඳී සිටින ඕනෑම අයෙකුට, එම සමාගම් හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සපුගස්කන්ද, මාකොළ යන ස්ථානයේ දී සාමාන්‍ය කාර්යාල වේලාවන්හි පරීක්ෂා කළ හැක.

ඒකාබද්ධ වන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2016 මාර්තු මස 16 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10

04-147

---

### ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

හෝකන්දර, හෝකන්දර උතුර අංක 113 හි පදිංචි රංගජිත් අසංක අබයසේකර (840822206 වී) වන මා විසින් හෝකන්දර, හෝකන්දර උතුර අංක 113 හි පදිංචි නදීකා රුවිනි අබයසේකර (777100467 වී) යන අයට දී තිබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ගිනිගේ විසින් ලියා සහතික කරන ලද 2011 පෙබරවාරි මස 21 වැනි දින සහ අංක 161 දරන ඇටෝර්නි බලපත්‍රය අද පටන් බල රහිත ප්‍රත්‍යාදිෂ්ඨ සහ නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙමි.

රංගජිත් අසංක අබයසේකර.

2016ක් වූ මාර්තු මස 08 වැනි දින.

04-150

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ස්විස්ට් ඉන්වෙස්ට්මන්ට් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111535
ලියාපදිංචි කළ දිනය : 2016.02.19
ලියාපදිංචි කළ ලිපිනය : අංක 380/95, බුලර්ස් පාර, කොළඹ 07.

ලේකම්.

04-154

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : යූ ඒ එස් ට්‍රැවල්ස් ඇන්ඩ් හොලිඩේස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 111350
ලියාපදිංචි කළ දිනය : 2016.01.19
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14/1, පාසල් මාවත, නිවන්තිඩිය, පිළියන්දල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු - 011 5922126.

04-266

---

### සංස්ථාපනය කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය
සමාගමේ නම : පී අයි ඇන්ඩ් ඒ ජී සෙරන්ඩිබ් ඇග්රෝ සෝර්සිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110305
සංස්ථාගත කිරීමේ දිනය : 2015 දෙසැම්බර් 08
ලියාපදිංචි කාර්යාලය : අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-188

---

### සංස්ථාපනය කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය.
සමාගමේ නම : එක්ස්සෙරන්ඩිබ් ට්‍රේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110296
සංස්ථාගත කිරීමේ දිනය : 2016 ජනවාරි 18
ලියාපදිංචි කාර්යාලය : 09 වැනි මහළ, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-189

---

### සංස්ථාගත කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ එන නිවේදනයයි
සමාගමේ නම : ක්‍රිස්ටල් ග්ලෝබ් ඩිවයින්ලෑන්ඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111001
සංස්ථාගත කළ දිනය : 2016 ජනවාරි 06
ලියාපදිංචි කාර්යාලය : අංක 170 සී, කොළඹ පාර, වැලිගම්පිටිය, ජා- ඇල.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-190

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි
සමාගමේ නම : එකෝ සෝලාර් රේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 110834
සංස්ථාගත කළ දිනය : 2015 දෙසැම්බර් 29
ලියාපදිංචි කාර්යාලය : අංක 28/5, 4 වන පටුමග, පිටකෝට්ටේ.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-191

---

### සංස්ථාපනය පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.
සමාගමේ නම : වූනා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108383
සංස්ථාගත කළ දිනය : 2015.09.15
ලියාපදිංචි ලිපිනය : අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

04-192

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කනත්තේවැව තැපැල් ඉහළ පැන්නිතව, මොරගොල්ලවත්ත, පී. එම්. නිහාල් ජයන්ත හේරත් පතිරාජ බාරේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 6117250233 X හිමි) දෙන් අමරසිංහ ආරච්චිගේ ලලනාවතී අමරසිංහ වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්, මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් දිසානායක මුදියන්සේලාගේ අයරින් මානෙල් දිසානායක (ජාතික හැඳුනුම්පත් අංක 576642660 V හිමි) යන අය පත් කරමින් දෙන ලද අංක 2631 සහ 2012.06.22 දිනත් දරන පීට නන්දසේන ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කරන ලද ලිඛිත බලධාරිකම් සහ ඇටර්නි බලපත්‍ර පොතේ 56 කාණ්ඩයේ 3947 පත් ඉරුවේ 2530 දින පොත් අංකය යටතේ 2012.08.13 දතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවය.

දෙන් අමරසිංහ ආරච්චිගේ ලලනාවතී අමරසිංහ.

2016 ජනවාරි මස 20 වැනි දින.

04-206

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි
සමාගමේ නම : මිහිර ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109394
ලියාපදිංචි දිනය : 2015.10.28
ලියාපදිංචි ලිපිනය : අංක 114/ඒ, තිස්ස මාවත, බංගලාවත්ත, කොට්ටාව, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

04-233

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධවය

(1) සමාගමේ නම : බැටිකලෝ ට්‍රේඩර්ස් ඇසෝසියේෂන්
(2) දිනය : 2015.11.17
(3) සමාගමේ ලියාපදිංචි අංකය : ජීඒ 3107
(4) ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 02, බන්ඩිංස් පටුමග, මඩකලපුව.

චන්ද්‍රවදනි වාසවන් මෙය,
සමාගම් ලේකම්.

04-263

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ක්‍රියේටිව් විෂන් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 111970
ලියාපදිංචි කළ දිනය : 2016.02.18
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 39, රිදීගම පාර, මල්ලවපිටිය, කුරුණෑගල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

දුරකථන අංක : 011- 5922126.

04-264

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ග්‍රීන් හෙල්ත් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 111453
ලියාපදිංචි කළ දිනය : 2016.01.22
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 377/1, නුවර පාර, මහර.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

දුරකථන අංක : 011- 5922126.

04-265

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ජී ඇන්ඩ් එෆ් හොටේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111604
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස කොළඹ 7
සංස්ථාගත දිනය : 2016 පෙබරවාරි 10 වැනිද

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

04-281

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගමේ නාමය : ජී ඇන්ඩ් එෆ් හොටේල් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112105
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස : කොළඹ 7
සංස්ථාගත දිනය : 2016 මාර්තු 04 වැනිද

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

04-282

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගමේ නාමය : ට්‍රැවල් වර්ල්ඩ් එක්ස්පීරියන්සස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111895
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත දිනය : 2016 පෙබරවාරි 16 වැනිද

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

04-283

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගමේ නාමය : සිල්පා ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112263
ලියාපදිංචි ලිපිනය : අංක 18/5, රොඩ්රිගෝ ඇවනියු, එපිටගල්පොත්ත පාර, නාවල
සංස්ථාගත දිනය : 2016 මාර්තු 08 වැනිද

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

04-284

---

### දැන්වීමයි

නැගෙනහිර අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය සල්පිටිගම අංක 01, පදිංචි දමයන්ති චන්ද්‍ර කුමාරි ගම්හේවගේ යන අය විසින් ඇටෝර්නි බලපත්‍ර පොතේ 93 කාණ්ඩයේ 58 පත්තිරුවේ 1318 දින පොතේ ලියාපදිංචි කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලයේ මහනුවර 2014.06.04 වැනි දින රෙජිස්ට්‍රාර් ජෙනරාල් සහතික කරමින් අත්සන් කරන ලද EP, LK 2257 දරන ලංකා අශෝක් ලේලන්ඩ් ලොරි රථය 2016.03.04 වැනි දින 2859 දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලදී.

04-499

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඒ එන් කේ ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109589
ලියාපදිංචි දිනය : 2015.11.04
ලියාපදිංචි ලිපිනය : අංක 29, අභයසිංහාරාම පාර, මරදාන, කොළඹ 10.

සමාගම් ලේකම්.

04-347

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : රිසර්ච් ඉන්ස්ටුමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106562
ලියාපදිංචි කළ දිනය : 2015 ජුනි 25
ලියාපදිංචි ලිපිනය : අංක 80/1, කොළඹ පාර, ඉංගිරිය.

අධ්‍යක්ෂ.

2016.03.18

04-356

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මදුරන්කුලිය , කනමූලෙයි හි පදිංචි නාගූර් පිච්චෙයි මුහම්මදු රාෆීස් (ජා. හැ. අ. 763021661 V) වන මා විසින් මදුරන්කුලිය, කනමූලෙයි දරන ස්ථානයෙහි පදිංචි ෆවුලුන් මරික්කාර් රිස්ෆිකාන් (ජා. හැ. අ. 780891700 V) යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. සම්සු රාෆි මහතා විසින් ලියා සහතික කරන ලද අංක 5830 හා 2013.02.09 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී ෆවුලුන් මරික්කාර් රිස්ෆිකාන් යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

නාගූර් පිච්චෙයි මුහම්මදු රාෆීස්.

04-357

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ලීගසි රියල්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112287,
ලියාපදිංචි ලිපිනය : අංක 12, විසාකා පටුමග, කොළඹ 04.

04-361/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : නිව් මව්ලානා කම්ප්ලෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112291
ලියාපදිංචි ලිපිනය : 184 - 186, 2 වැනි හරස් වීදිය, කොළඹ 11.

04-361/2

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙනියාය පල්ලෙගම පාරේ රත්නායක තේ කර්මාන්ත ශාලාව අසල පදිංචි හසිත හිරන්ත හෙට්ටිආරච්චි වන මම (ජාතික හැඳුනුම්පත් අංක 893491961 V) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි මහජනතාව වෙත මෙයින් දැනුම්දෙන වග නම් එම ලිපිනයේ ම පදිංචි හැව්ඕවිට ලියනගේ දුලාංජනී (ජාතික හැඳුනුම්පත් අංක 905942476 V) වෙත ප්‍රදානය කරන ලද මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පී. ශ්‍යාමලී මහත්මිය විසින් සහතික කරන ලද අංක 3371 හා 2013.10.15 දින දරන ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කරන ලද බවයි. තවද, ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මත මාගේ නමින් හෝ මා වෙනුවෙන් එකී හැව්ඕවිට ලියනගේ දුලාංජනී විසින් සිදුකරනු ලබන කිසියම් ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මාගේ වගකීමක් හෝ බැඳීමක් නොමැත.

04-363

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාගම, පේරලන්දේ අලුත් මාවත, 373/4 දරන ස්ථානයේ පදිංචි පෙනිලෝප් ඇන් මොරිටා අරුණ බඩතුරුගේ වන මම පිළිමතලාව ගඩලාදෙණිය පදිංචි තුෂාර බටතුරුගේ ජා. හැ. අංක 731001855 V යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් සභාපති පරමසෝති ප්‍රසිද්ධ නොතාරිස් තැන අංක 86/1, යටිනුවර වීදිය, මහනුවර වසර 2012 පෙබරවාරි මස 02 වැනි දින සහතික කළ අංක 3736 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දෙන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි. එය මත මින් ඉදිරියට ඉහත කී තුෂාර බටතුරුගේ විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බවට ප්‍රකාශ කරමි.

පෙනිලෝප් ඇන් මොරිටා අරුණ බඩතුරුගේ.

04-391

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. එස්. රාජපක්ෂ
ගිණුම් අංක 0005 5004 2371

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 සැප්තැම්බර් මස 29 දින සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහහත් ලක්ෂ තිස්අට දහස් පන්සිය හැත්තෑ අටයි ශත අනූ දෙකක (රු. 1,738,578.92) මුදල ද, 2008 ජූලි 29 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහහතර ලක්ෂ අසූපන් දහස් හයසිය හැට තුනයි ශත දහහතරක (රු. 1,485,663.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතයි දශම පහක් (17.5%) හා තවත් රුපියල් එක් ලක්ෂ පනස් පන් දහස් හැටහතයි ශත පනස් නමයක (රු. 155,067.59) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2009.07.31 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009.07.20 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2016.05.05 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිසත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාකොළ දකුණ පිහිටි දේවාල පාර වරිපනම් අංක 14/2 දරන "කජුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එම්. ආරියසේන යන අය විසින් සාදන ලද 2003 දෙසැම්බර් මස 17 දාතම හා අංක 1744 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 03 සහ 1, නැගෙනහිරට: ලොට් 1 සහ මිල්ටන් වික්‍රමසිරි සහ වෙනත් අයගේ ඉඩම, දකුණට : මිල්ටන් වික්‍රමසිරි සහ වෙනත් අයගේ ඉඩම සහ 1996 මැයි 04 දාතම හා අංක 852 දරන පිඹුරේ ලොට් බී සහ බස්නාහිරට : එකී අංක 852 දරන පිඹුරේ ලොට් බී, පාර සහ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයක් (අ. 0 රූ. 0 පර්. 12.6) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, සමග එකී අංක 1744 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 774/181 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

දිගේ සහ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය -

අංක 1744 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3

බලයලත් මානක තැන එල්. ඒ. පී. පෙරේරා යන අය විසින් සාදන ලද 1996 මැයි 04 දාතම හා අංක 852 දරන පිඹුරේ නිරූපිත ලොට් ඊ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

04-352

---

### පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවා පත්තු දකුණේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නෙතොල්පිටිය තංගල්ල ප්‍රාදේශීය සභාවේ, රන්න බටහිර ග්‍රාම නිලධාරි සීමාව ඇතුළත රන්න ග්‍රාමයේ පිහිටා ඇති මීගහකොරටුව නැමැති ඉඩමට බලයලත් මානක එච්. සිරිබද්ධන විසින් මැන සාදන වර්ෂ 2010.11.25 දිනැති අංක 4539 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 2 බී දරන ඉඩම් කොටස සහ ඉඩම සහ ඒ මත වූ ගහකොළ, වැව්ලි සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

(බිම් ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 13)
වර්ෂ 2016ක් වූ අප්‍රේල් මස 29 වැනි දින ප.ව. 1.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය.* - තංගල්ල නගරයේ සිට හම්බන්තොට පාර දිගේ කි. මී. 5ක් රන්න හන්දියෙන් වමට හැරී රන්න වීරකැටිය පාර දිගේ මීටර් 15ක් පමණ ගමන් කළ විට දකුණට වන්නට විෂයගත දේපළට පිවිසිය හැක.

ප්‍රදීප් නිරෝෂන් ජයරත්න විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.07.19 දිනැති අංක 13811 දරන ප්‍රාථමික අකස් බැඳුම්කරය සහ වර්ෂ 2013.07.19 දිනැති අංක 13813 දරන අතිරේක උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදය සඳහා 2015.10.23 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් සහ එදින *ගැසට්පතද* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10%ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500ක් ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ප්‍රධානී ණය අයකර ගැනීම් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාළු පාර, කොළඹ 03. දුරකථන අංක 2565573/2565565, 011-4667214, 011-4667237, 011- 4667229.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොළොන්නාව.

04-377

---

### පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ (තන්තිරිමුල්ල උප කාර්යාලය) පානදුර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ හිරන නැගෙනහිර අංක 676 ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත ගල්තුඩේ සහ හිරන ග්‍රාමයන්හි පිහිටා ඇති "රත්නගිරිය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක සී. ඩබ්ලිව්. ද නීස් විසින් සකසන ලද අංක 448 සහ 1961.12.29 වැනි දිනැති පිඹුරෙහි ලොට් 51 හි නැවත මැනීමක් වන) බලයලත් මානක ජී.මල්වැන්න විසින් සකසන ලද අංක 4374 සහ 2010ක් වූ ජුනි මස 26 දිනැති පිඹුරේ ලොට් 51 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල වේ.

(බිම් ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 32)
වර්ෂ 2016ක් වූ අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 11.00) ට

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට ගාළු පාර දිගේ පානදුර රෝහල් හන්දිය දක්වා කි. මී. 27ක් පමණ වූ දුර ප්‍රමාණයක් ගමන් කර හිරන පාරෙන් වමට හැරී මීටර් 4.2ක් පමණ ඒජන්ත වංගුව පිටුපසින් මීටර් 300ක් පමණ එකී පාරේ ගිය විට වම් අත පැත්තේ පිහිටා ඇති විෂයගත දේපළට පිවිසිය හැක.

ට්‍රාන්ස්වෝටර් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.12.20 දිනැති අංක 2449 දරන ප්‍රාථමික උකස් බැදුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදය සඳහා 2016.03.18 වැනි දින ඩේයිලි නිවුස් ලක්බිම, සුඩල් ඔලි පුවත් පත් සහ එදින *ගැසට්* පතද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10%ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500ක් ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමණාකරු ණය අයකර ගැනීම් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය අංක 450 ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667266.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක : 011- 3068185, ෆැක්ස් අංකය : 011- 2572940.

04-374

---

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හලාවත දිසා අධිකරණයේ දී ය.

චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්
දැනට
චිලව් ෆිනෑන්ස් පීඑල්සී 44 ඒ, කුරුණෑගල පාර,
හලාවත.

*...........................පැමිණිලිකරු.*

නඩු අංකය :
4406/13/MDR

*-එදිරිව-*

01. පෝරුතොටගේ මුදිත් සුසන්ත ප්‍රනාන්දු
114 බී, මුදුවෙරළ පාර, තොඩුවාව
02. වර්ණකුලසූරිය මාජි කුසුම් ජිතානි ප්‍රනාන්දු
395 ඒ, මැදතොඩුවාව, තොඩුවාව.

*.........................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2013 ක් වූ ජුනි මස 26 වැනි දින මෙම නඩුවේ 02 වන විත්තිකාරියට එරෙහිව නියම කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශ අනුව

ඒ අනුව ඉහත නම සඳහන් 02 විත්තිකාරිය විසින් පැමිණිලිකරුට

වර්ෂ 2013.06.26 වැනි දින මෙම නඩුවේ 02 වන විත්තිකාරියට එරෙහිව නියත කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශ අනුව පැමිණිළිකාර සමාගමට 02 වන විත්තිකාරියගෙන් අය විය යුතු මුළු මුදල රුපියල් 11,22,405.71 ක මුදලක් සහ ඊට අමතරව රුපියල් 732,569.09 ක මුදලකට 2013.01.03 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 22% බැගින් වන පොළී මුදලක් ද එකී සමස්ථ මුදලම ගෙවා අවසන් වන තුරු එකී සමස්ථ මුදලට ම වර්ෂයකට 22% බැගින් වන පොළී මුදලක් ද බවට තීරණය කර ඇත.

එම මුදලින් 01 වන විත්තිකරු විසින් රුපියල් 422,196.88 මුදලක් ගෙවා ඇති අතර එකී 02 වන විත්තිකාරියට එරෙහිව නියත කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශ අනුව 02 වන විත්තිකාරියගෙන් අයවිය යුතු හිඟ මුදල වන රුපියල් 13,81,907.70 ක මුදල ගෙවීම 02 වන විත්තිකාරිය විසින් පැහැර හැර ඇත.

වර්ෂ 2013ක් වූ ජුනි මස 26 වැනි දින හලාවත දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට 02 විත්තිකාරිය අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී, වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 29 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### *උපලේඛනය*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළේ, යටකලන් පත්තුවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ උතුරු තොඩුවාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු තොඩුවාවේ පිහිටි පලුගහවත්ත කියන යූ. එල්. වාසල මානක නිලධාරි විසින් 2010.01.12 වැනි දින මැන සාදන ලද අංක 5332 දරන පිඹුරේ ලොට් 01 දරන උතුරට ඩබ්ලිව්. අන්තෝනි පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : බැසිල් ප්‍රනාන්දු ට සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට :ඩබ්ලිව්. විල්ප්‍රඩ් ප්‍රනාන්දුට සහ තවත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : ෂේවියර්ට අයිති ඉඩම ද, හලාවත සිට තල්විට දක්වා දිවෙන ප්‍රධාන පාර දක්වා දිවෙන අඩි 10ක් පළල පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් අටක් (අ. 0, රූ. 0, පර්. 38) විශාල ඉඩම හා ඒ මත පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේත් සහ එකී සිතියමේ බස්නාහිර මායිමේ පිහිටි අඩි 10ක් පළල පාර පොදුවේ පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම් ද සමග වේ. මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 75/66 හි ලියාපදිංචි කර ඇත.

ඉඩමට පිවිසීම.- මහවැව නගරයේ සිට තොඩුවාව පාරේ කි. මී. 3 1/2ක් පමණ ගොස් කුඩාමඩුවැල්ල තැපැල් කන්තෝරුවට පෙර දකුණට හැරී හලාවත පාරේ (තාර පාරේ) කි. මී. 12 1/4 පමණ ගොස් දකුණට ඇති බොරළු පාරේ මීටර් 125ක් පමණ ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත භාරගනු නොලැබේ.

(01) ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 9,000, (03) සියලුම ප්‍රචාරක වියදම්, (04) වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු, (05) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු, (06) ලිපිකරු, බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500, (6) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%), මුදල දින 30ක් ඇතුළත දී හලාවත දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීමට සහ වෙනත් විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු.
තක්සේරුකරු හා උසාවි කොමසාරිස් බස්නාහිර
පළාතේ වානිජ මහාධිකරණය සහ කොළඹ දිසා
අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ බලයලත්
වෙන්දේසිකරු රාජ්‍ය හා වානිජ බැංකු

අංක 200, 2 වන මහල හල්ෆ්ඩ්‍රොප් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක 011 - 2445393/011 - 2396520,
ඊමේල් : senaservice@sltnet.lk

සාමාන්‍යාධිකාරිතුමා,
චිලව් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 44 ඒ,
කුරුණෑගල පර, හලාවත.
දුරකථන අංක 032 - 2222055/032 - 2224533,
ෆැක්ස් අංකය : 032 - 2223273.

04-269

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී දඹුල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී ආර් පී ගාල්ලගේ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2012.07.10 දිනැති සහ අංක 1708 බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙන්නකෝන් මුදියන්සේලාගේ ශානක සම්පත් බංඩාර සහ රත්නායක මුදියන්සේලාගේ නිරෝෂිනී රත්නායක ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ අප්‍රේල් මස 26 වැනි දින පෙ. ව. 10.30 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ වගපනහ පල්ලේසියපත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ හලුඅපුල්ලනවැව අලුත් වත්ත ගමෙහි පිහිටි මෙනේරියාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් පිළියෙල කරන ලද 2010 දෙසැම්බර් මස 02 වැනි දින අංක 5080 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටස සහ එහි පිහිටි ගහකොළ සහ සියලුම දේත් විශාලත්වය පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.03.04 දින රජයේ ගැසට් පත්‍රය හා 2016.03.08 දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - දඹුල්ල ඔරලෝසු කණුව හන්දියේ සිට කුරුණෑගල පාරේ කි. මී. 1.1 පමණ වැඩිහිටි නිවාසය දක්වා ගමන් කර බෝක්කු අංක 90/6 සහ 90/5 අතරින් දකුණට හැරී රථවාහන ගමන් කළ හැකි කොන්ක්‍රීට් අතුරා ඇති සහ බොරලු පාරේ මීටර් 200ක් පමණ ගමන් කර එතැනින් දකුණට හැරී තවදුරටත් මීටර් 150ක් පමණ ගිය තැන එම පාරේ දකුණට මුහුණ ලා අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000),
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීම බැංකුවට අයිතිය ඇත.

*අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු.*- ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
(දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබාගත හැකිය.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 113,
උසාවිය පාර, කොළඹ 12
දුරකථන අංක 0777-378441, 0714 - 424478, 0112 - 509442.

04-345

---

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

හලාවත දිසා අධිකරණයේ දී ය

චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්,
අංක 44 ඒ, කුරුණෑගල පාර,
හලාවත.

නඩු අංකය : ................................පැමිණිලිකරු.
4052/10/MDR

*එදිරිව*

01. වර්ණකුලසූරිය රසිකා සුජානි ප්‍රනාන්දු
02. වර්ණකුලසූරිය ජෝෂප් කැනීසියුස් නිහාල් ප්‍රනාන්දු

දෙදෙනාම
සින්න කරුකුපනේ, බංගදෙනිය.

............................විත්තිකරුවන් .

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය ප්‍රකාරව වර්ෂ 2013 මැයි මස 27 දින දරන සමථ තීන්දු ප්‍රකාශය පරිදි ඉහත නම සඳහන් විත්තිකරුවන් පැමිණිලිකාර සමාගමට රු. 3,596,590.00 ක මුදලක් ගෙවිය යුතුව තිබුන ද එම මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට විත්තිකරුවන් අපොහොසත් වූ හෙයින් එකී මුදල සහ අනෙකුත් ගාස්තු අයකර දීම සඳහා මෙහි පහත සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ අප්‍රේල් මස 05 වැනි දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*උපලේඛනය*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැල් අර ග්‍රාම නිලධාරි වසමේ කුරුණෑගල පාරේ පිහිටි කුන්ජි අඩප්පනාර්වෙල බර්ට්‍රම් ද සිල්වා මානක නිලධාරි විසින් 1967 නොවැම්බර් මස 16 දින මැන සාදන ලද අංක 234 දරන පිඹුරේ ලොට් 22 උතුරට : එකී අංක 234 පිඹුරේ ලොට් 21 ද, නැගෙනහිරට: 1655 පිඹුරේ සඳහන් මාටින් සිල්වාට අයිති ඉඩම ද, දකුණට : ජේ. ඒ. ඩී. කොරයාගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : එකී අංක 234 පිඹුරේ දැක්වෙන පාරකට හැර තිබෙන රක්ෂිත බිම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 16.4) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු සහ ගොඩනැගිලි ආදී ඊට අයත් සැම සියලු දේද වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 185/118 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.* - හලාවත නගරයේ සිට කුරුණෑගල පාරෙන් මීටර් 400 දුරින් දකුණු දෙසට සේදවත්ත පාර හමුවන අතර එම පාර ඔස්සේ මීටර් 200 දුරින් වම් දෙසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 25%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 1,500,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,
(7) ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද,

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත හලාවත දිසා අදිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් ඒ වන තුරු ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත වෙන්දේසිය සඳහා ඉල්ලීමක් කිරීමට පැමිණිලිකාර සමාගමට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සහකාර සාමාන්‍යාධිකාරි,
චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්
අංක 44ඒ, කුරුණෑගල පාර, හලාවත.
දුරකථන අංක : 032 -2222055, 032 -2222285, 032 - 2224532. -
Chilaw Finance PLC

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
උසාවි කොමසාරිස්.

අංක 9, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක : 071 4318252, 011- 2173282.

04-367

---

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

අතුරුගිරිය ඔරුවල පිහිටි "කිඹුලාවලලන්ද' නමැති ඉඩමේ ලොට් අංක 11 දරන කැබැල්ල තුළ පිහිටි ගොඩනැගිල්ලක් සහිත පර්චස් 10.70ක් විශාලැති අගනා දේපළ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාව තුළ අතුරුගිරිය ඔරුවල පිහිටි කිඹුලාවලලන්ද නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන කොටසට එස්. පී. රණසිංහ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද වර්ෂ 2006 මාර්තු මස 06 වැනි දින සහ අංක 2431A දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 11 උතුරට : මෙම පිඹුරේ ලොට් අංක 14 නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් අංක 12 දකුණට : මෙම පිඹුරේ ලොට් අංක 9 සහ 10 සහ බටහිරට : මෙම පිඹුරේ ලොට් අංක 16 සහ 17 යන මායිම් තුළ වූ පර්චස් දහයයි දශම හතයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 10.70) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ ගහකොළ පළතුරු ආදී සියලු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1610/222 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාව තුළ අතුරුගිරිය ඔරුවල පිහිටි කිඹුලාවලලන්ද නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 16 දරන කොටසට (මීටර් 10ක් පළල මහජන මාවත සඳහා කරන ලද වෙන් කිරීම) එස්. පී. රණසිංහ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද වර්ෂ 2006 මාර්තු මස 06 වැනි දින සහ අංක 2431A දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 16 උතුරට : පිට අගල සහ මෙම පිඹුරේ ලොට් අංක 17, 10, 9, 8, 13 සහ 7 නැගෙනහිරට : 1437 දරන පිඹුරේ ලොට් 02 සහ මෙම පිඹුරේ ලොට් 10 සහ 11 දකුණට : ප්‍රාදේශීය සභා පාර (මහජන මාවත) සහ බටහිරට : ප්‍රාදේශීය සභා පාර (මහජන මාවත) යන මායිම් තුළ වූ පර්චස් තුනයි දශම හතයි හතරක් (අ. 0 රූ. 0 පර්චස් 3.74) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ ගහකොළ පළතුරු ආදී සියලු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1610/238 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාව තුළ අතුරුගිරිය ඔරුවල පිහිටි කිඹුලාවලලන්ද නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 16 දරන කොටසට (අඩි 1ක් පළල වූ කාණුවක් සඳහා කරන ලද වෙන් කිරීම) එස්. පී. රණසිංහ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද වර්ෂ 2006 මාර්තු මස 06 වැනි දින සහ අංක 2431A දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 16 උතුරට : පිට අගල නැගෙනහිරට පිට අගල දකුණට : මෙමම පිඹුරේ ලොට් 1 සහ බටහිරට පිට අගල යන මායිම් තුළ වූ පර්චස් තුනයි දශම හතයි හතරක් (අ. 0 රූ. 0 පර්. 3.74) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ ගහකොළ පළතුරු ආදී සියලු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1610/241 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

රු. 564,176.08 ක මුදලක් සහ රු. 882,150.61 ක මුදලක් ද, එම මුදල් ප්‍රමාණය මත 2011 ජූලි මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වර්ෂයකට 30% ක පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් සමස්ථ මුදල මත එකී මුදල් සම්පූර්ණ සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තුරු එකී මුදල් මත නෛතික පොළිය ද නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම පිණිස අතුරුගිරිය ඔරුවල, මහදෙණිය අංක 4 දරන ස්ථානයේ පදිංචි වරකාගොඩ විදානලාගේ දොන් සංජය චාමින්ද සහ පතිරන්නාලාගේ අනුෂා නිල්මිණි යන අයට විරුද්ධව කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක 28 දරන ස්ථානයේ පිහිටි බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් හි පිහිටි පෙර එම් බී එස් එල් සේවින්ගිස් බැන්ක් ලිමිටඩ් සහ සෙලින්කෝ සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ් හා දැනට මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී විසින් කොළඹ දිසා අධිකරණයේ පවරන ලද අංක : DMB 0075/11 දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2016ක් වූ මැයි මස 04 වැනි දින පෙරවරු 10.30 කණිසමට මා විසින් දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය .*- අතුරුගිරිය නගරයේ සිට කඩුවෙල පාර ඔස්සේ මිලේනියම් සිටි පසුකර එගොඩවත්ත දක්වා කි. මී. 3ක් පමණ ගමන් කර දකුණට හැරී වාහන ගමන් කළ හැකි මහජන මාවත ඔස්සේ තවත් මීටර් 500ක් පමණ ගමන් කිරීමෙන් වමට පිහිටා ඇති වංගුවේ මෙම පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේම වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු වශයෙන් 2.5%ක් ද, (4) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් ද, (5) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500 ක මුදලක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 7,500ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක 28 දරන ස්ථානයේ පිහිටි "බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්" හි 10 වන මහලේ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ නීති කළමණාකාරිණිගෙන් විමසන්න. දුරකථන අංක : 0114 711711, 011 - 4063425, 011 - 4710501.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011 - 2873656, 0777-672082, ෆැක්ස් : 2871184.

04-362

---

**පොලිස් නිල සුනඛ කොට්ඨාසය**

පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 22 දෙනෙකු 2016.04.09 වැනි දින පැය 0900 ට මහනුවර අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් එදින උදේ පැය 0800 ට පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිම.

| *අනු. අංකය* | *වර්ගය* | *පිරිමි* | *ගැහැණු* | *එකතුව* |
|---|---|---|---|---|
| 01. | ජර්මන් ෂෙපර්ඩ් | 05 | 06 | 11 |
| 02. | ලැබ්‍රඩෝර් රිට්රිවර් | 02 | 02 | 04 |
| 03. | බෙල්ජියම් මැලිනොයිස් | 02 | - | 02 |
| 04. | ඩොබමන් පීන්සර් | 02 | 03 | 05 |
| | එකතුව | | | 22 |

එච්. එම්. සිසිර වීරකෝන් හේරත්,
පොලිස් අධිකාරි,
අධ්‍යක්ෂ,
නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය, මහනුවර.

2016 මාර්තු 16 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය, මහනුවර.

04-216

---

